වාර්ෂික වාර්තාව 2024

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

ஆண்டறிக்கை 2024

முகாமைத்துவ பட்டப்பின்படிப்பு நிறுவகம்

ஸ்ரீ ஜயவர்தனபுர பல்கலைக்கழகம்

Annual Report 2024

POSTGRADUATE INSTITUTE OF MANAGEMENT


University of Sri Jayewardenepura




“නව ලොව”

සඳහා PIM ව්‍යාපාර පාසල

ස්ථාපිත කිරීම



දැක්ම, මෙහෙවර සහ වටිනාකම්



ඇල්ම	අවංකභාවය	අවධානයෙන් සිටීම
ප්‍රතිඵල කෙරෙහි උද්යෝගය සහ උනන්දුව ප්‍රදර්ශනය කිරීමේ පරිවය ක්‍රියාවන්හි වෘත්තීයභාවය පෙන්වීම සහ නීති රීතිවලට අනුකූලව පූර්ණ සහයෝගයෙන් කටයුතු කිරීම.	ලබා දී ඇති කාර්යයන් සමූහයක් ඉටු කිරීම සඳහා මුළු හදවතින්ම දායකත්වය ලබා දීම සහ ආයතනයේ යහපත ගැන සිතමින් සදාචාරාත්මකව කටයුතු කිරීම.	කාර්යයන් ඉටු කිරීමේදී ඒකාග්‍ර අවධානය පවත්වා ගැනීම සහ වෙනත් පුද්ගලයෙකුගේ දෘෂ්ටිකෝණයෙන් බැලීමෙන් ඔහුගේ අත්දැකීම් අවබෝධ කර ගැනීම.
ප්‍රධාන හැසිරීම් සාධක (KBIs)	***ප්‍රධාන හැසිරීම් සාධක (KBIs)***	***ප්‍රධාන හැසිරීම් සාධක (KBIs)***
• අපේක්ෂිත පුරුදුවලින් බැහැර නොවී ස්වයං පාලනයක් පෙන්නුම් කරයි. • නීති රීති ක්‍රියාත්මක කිරීමේදී කැමැත්තෙන් සහයෝගය දක්වයි. • ප්‍රතිඵ ලබා ගැනීමට ඇති ආශාව පෙන්නුම් කරයි. • ක්‍රියාවෙහි ශක්තිය සහ ගතිකත්වය විදහා දක්වයි.	• ආයතනයේ යහපත වෙනුවෙන් කාලය හා ශක්තිය කැප කරයි. • පවරා ඇති ඉලක්ක සපුරා ගැනීම සඳහා ඉහළ මැදිහත්වීමක් පෙන්නුම් කරයි. • ගැටලුවකට ප්‍රවේශ වීමේ ධනාත්මක සහ උද්යෝගිමත් ක්‍රම පෙන්වා දෙයි.	• පවරා ඇති කාර්යයන් හැසිරවීමේදී අවධානයකින් යුතුව සිදු කරයි. • රැකියාවට අදාළ වගකීම් ඉටු කිරීමේදී සවිස්තරාත්මකව අවධානය යොමු කරයි. • රාජකාරි ඉටු කිරීමේදී උපරිම අවධානය යොමු කරයි. • අනෙක් පුද්ගලයාගේ දෘෂ්ටිකෝණයට සවන් දෙන අතර අනෙකා ගැටලුවක් දෙස බලන ආකාරය වටහා ගැනීමට උත්සාහ කරයි.

පටුන

දැක්ම, මෙහෙවර සහ වටිනාකම්	ii
අධ්‍යක්ෂවරයාගේ පණිවිඩය	1
කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය (PIM) පිළිබඳව	2
කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ජයගීතය	3
කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ජයගීතය (ඉංග්‍රීසි පරිවර්තනය)	4
කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ජයගීතය (දෙමළ පරිවර්තනය)	5
ආයතනය සහ විශ්වවිද්‍යාලය	6
අපි කවුරුන්ද?	7
පාලනය	10
ආයතනයේ පාලන මණ්ඩලය	10
සංවිධාන සටහන	15
ආයතනයේ ශක්තිය	16
ආයතනයේ ආයතනික පාලනය	17
අවදානම් කළමනාකරණය	18
වටිනාකම් අභිප්‍රේරකය (Value Driver) 1 – නව්‍ය ඉගැන්වීම හා ඉගෙනුම	21
වටිනාකම් අභිප්‍රේරකය 2 - ගැඹුරු අවබෝධයක් සහිත සහ අදාළ පර්යේෂණ සහ ප්‍රකාශන	23
වටිනාකම් අභිප්‍රේරකය 3 – සහයෝගීතා සහ හවුල්කාරිත්වයන් පොහොසත් කිරීම	29
වටිනාකම් අභිප්‍රේරකය (Value Driver) 4 – අනාගත ධාරිතා ගොඩනැගීම සහ නායකත්ව සංවර්ධනය	38
බලගැන්වීමේ සාධකය (Enabler) 01: ලොව පිළිගත් මට්ටමේ ගුණාත්මකභාවය	42
බලගැන්වීමේ සාධකය (Enabler) 02: ආදර්ශවත් පාලනය	45
බලගැන්වීමේ සාධකය (Enabler) 3: තිරසරත්වය සඳහා පෙළඹවීම	46
බලගැන්වීමේ සාධකය (Enabler) 04: නව්‍ය ඩිජිටල් විශිෂ්ටත්වය	51
ස්වොට් (SWOT) විශ්ලේෂණය	54
වත්මන් කාර්යසාධනය	55
කාර්ය මණ්ඩල විස්තර	57
පාඨමාලා	58
සමස්ත ආයතනය	67
ජාත්‍යන්තර සහයෝගීතාව	67
තනි පුද්ගල උපදේශනය	68
PIM ව්‍යාපාර ඉන්කියුබේටරය “Genesis”	68
මහාචාර්ය උදිත ලියනගේ අනුස්මරණ පුස්තකාලය	69
කලමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ තොරතරු තාක්ෂණ මධ්‍යස්ථානය	69
තත්ත්ව සහතිකකරණය සහ ප්‍රතිඥතය	70
සමකාලීන ඉගෙනුම් පරිසරය	70
කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ	71
ආදි විද්‍යාර්ථීන්	71
පර්යේෂණ	71
පර්යේෂණ මධ්‍යස්ථානය	71
ආයතනය විසින් ප්‍රකාශයට පත්කරන ප්‍රකාශන	72
අභ්‍යන්තර විගණන අංශය	75

සමස්ත මූල්‍ය සමාලෝචනය 76
පසුගිය වසර 10 තුළ මූල්‍යමය සුවිශේෂ අවස්ථා 81
මූල්‍ය ප්‍රකාශන 82
විගණකාධිපති වාර්තාව 110
විගණකාධිපති වාර්තාවට පිළිතුරු 117

අධ්‍යක්ෂවරයාගේ පණිවිඩය



2024 වසර සඳහා කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ (PIM) වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරනු ලබනුයේ ඉමහත් අභිමානයකිනි. පසුගිය වසර අප රටේ ආර්ථික හා සමාජීය අවිනිශ්චිතතාවයේ යුගයක් ලෙස සනිටුහන් වී ඇත. වේගවත් තාක්ෂණික දියුණුව සහ වෙනස්වන ගෝලීය ගතිකතාවයන් බහුලව පැවති ලෝකයක, ශ්‍රී ලංකාවේ පශ්චාත් උපාධි අධ්‍යාපනයේ විශිෂ්ටත්වය සඳහා කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ සිය කැපවීම ස්ථිරව පවත්වා ගන්නා ලදී.

1998 වර්ෂයේ සිට ස්වයං මූල්‍යයනය වනු ලබන සහ අර්ධ ස්වයං පාලන රාජ්‍ය ආයතනයක් වන කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය, එහි කළමනාකරණ මණ්ඩලය සහ අධ්‍යයන මණ්ඩල විසින් මාර්ගෝපදේශනය හා මෙහෙයවීම සිදු කරනු ලබන අතර, 2024 වර්ෂය සඳහා ආයතනික සැලැස්ම මගින් නියම කර ඇති ඉලක්ක සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. ආයතනයේ වැඩසටහන් කළඹ පුරා දේශීය හා ජාත්‍යන්තර ශිෂ්‍ය ලියාපදිංචිය සහ උපාධිධාරී ප්‍රතිදානයන් වැඩිවීම මෙන්ම පර්යේෂණ ප්‍රතිදානයන්හි වැඩිවීම තුළින් මෙය පිළිබිඹු වේ. අනාගත නායකයින් සංවර්ධනය කිරීමේ දී ආයතනික ක්ෂේත්‍රයට වටිනාකමක් එක් කිරීමෙන් විධායක සංවර්ධන අංශයේ පැවැත්ම වැඩි දියුණු කිරීමට කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය සමත් විය. තම ඉගෙනුම් හවුල්කරුවන්ට හිතකර සහ හොඳම පන්ති කාමර ඉගෙනුම් පරිසරයක් ලබා දීම සඳහා යටිතල පහසුකම් සහ තොරතුරු තාක්ෂණ පහසුකම් වැඩිදියුණු කිරීම කෙරෙහි ද කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය අවධානය යොමු කර ඇත. ඊට අමතරව, දකුණු ආසියාවේ කළමනාකරණ සංවර්ධන ආයතන සංගමය (AMDISA) හරහා දකුණු ආසියානු තත්ත්ව සහතිකකරණ පද්ධති (SAQS) ප්‍රතිනතය ලබා ගැනීමේ ක්‍රියාවලියේ දී කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය වේගවත් ප්‍රගතියක් ලබා ගෙන ඇත.

පසුගිය වර්ෂය, පර්යේෂණ සංස්කෘතියක් සහ අධ්‍යයන විශිෂ්ටත්වයක් ඇති කිරීම සඳහා පීඨයේ කැපවීම පිළිබඳ මනා සාක්ෂියකි. පැහැදිලි උපදෙස් සහ ප්‍රායෝගික අත්දැකීම් ඒකාබද්ධ කරන විෂය මාලාවක් හරහා, අපගේ ඉගෙනුම් හවුල්කරුවන්ට වත්මන් නවීන වැඩ පරිසරයේ සාර්ථක වීමට අවශ්‍ය කුසලතා, දැනුම සහ ආකල්ප අපි සපයා ඇත්තෙමු. අපගේ පීඨය සහ අපගේ ඉගෙනුම් හවුල්කරුවෝ ඉහළ බලපෑමක් ඇති පර්යේෂණ ප්‍රකාශයට පත් කර, සම්මන්ත්‍රණ සංවිධානය කර සහභාගී වී, ඇගයීම් ලබාගෙන සහ ජාතික හා ජාත්‍යන්තර පිළිගැනීමක් අත්පත් කරගෙන ඇති සහයෝගී ව්‍යාපෘතිවල නියැලී සිටිති.

අවසාන වශයෙන්, පසුගිය වසරේ ද, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයට මහා භාණ්ඩාගාරයට දායකත්වයක් ලබා දෙන අතරම ස්වයං මූල්‍ය ආයතනයක් ලෙස එහි තත්ත්වය ශක්තිමත් කර ගැනීමට හැකි විය. අපගේ පොදු දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා ඔවුන්ගේ අඛණ්ඩ සහයෝගය සහ කැපවීම වෙනුවෙන් අපගේ පීඨයට, කාර්ය මණ්ඩලයට සහ ඉගෙනුම් හවුල්කරුවන්ට මම අවංකවම ස්තූතිවන්ත වෙමි. 'නව ලෝකය සඳහා ව්‍යාපාරික පාසල' බවට පත්වීමේ අපගේ ගමනේදී අපි එක්ව ශ්‍රී ලංකාවේ සහ ඉන් ඔබ්බට කළමනාකරණ පශ්චාත් උපාධි අධ්‍යාපනයේ අනාගතය හැඩගස්වන්නෙමු.

ආචාර්ය අසංග රණසිංහ
අධ්‍යක්ෂ

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය (PIM) පිළිබඳව

ශ්‍රී ලංකාවේ උසස් කළමනාකරණ අධ්‍යාපනයේ සහ පුහුණුවේ පුරෝගාමියා ලෙස, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය (PIM) වසර 38 කට අධික කාලයක් ව්‍යාපාරික ප්‍රජාවට සහ රට වෙනුවෙන් සේවය සපයා ඇත. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධ අර්ධ ස්වයංපාලිත ආයතනයක් ලෙස, එය කර්මාන්ත, ශාස්ත්‍රීය සහ රජයේ නියෝජිතයින්ගෙන් සමන්විත කළමනාකරණ මණ්ඩලයක් මගින් පාලනය වේ. කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය රටේ විශ්වවිද්‍යාල පද්ධතියේ එකම ස්වයං මූල්‍යයන ආයතනයයි. කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ පශ්චාත් උපාධි පාඨමාලා වාර්ෂිකව කළමනාකරුවන් සිය ගණනක් ආකර්ෂණය කර ගන්නේ එය ශ්‍රී ලංකාවේ කළමනාකරණයේ වඩාත්ම අභියෝගාත්මක ඉගෙනුම් අවස්ථා සපයන බැවිනි.



කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ජයගීතය

ජයවද්දන පුර විදුදය සරසවි
පද්ම තටාකේ විකසිත පියුම ඔබ යි
පින්බර අප විද්‍යා භූමි
කිතු ගොස දස දෙස විදා
වොරැඳේවා ජය දැද බන්දා
පින්බර අප විද්‍යා භූමි
දියුණුව සලසන නව්‍ය තාක්ෂණ
විදුරුවන් කිරණ නොමින් පෙරා ගෙන
මානව ශ්‍රම ගුණ නිසි ලෙස යොදවන
කළමනාකරණ විදුනැණ වඩවන
සරසවි වරමින් නැණ ගුණ රන්දන
ජය මඟ පාදන නියමු නිකේතන
සිරිලක සිරිසර මල්පල ගන්වන
විදුබිම නන්දන කරනෙමු වන්දන
ජයවද්දන පුර විදුදය සරසවි
පද්ම තටාකේ විකසිත පියුම ඔබ යි
පින්බර අප විද්‍යා භූමි
කිතු ගොස දස දෙස විදා
වොරැඳේවා ජය දැද බන්දා
පින්බර අප විද්‍යා භූමි

ගී පද රචනය: ආචාර්ය එච් ඒ පී අබේවර්ධන
ගී තනු නිර්මාණය: විශාරද ආචාර්ය ඩබ් ඩී අමරදේව

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ජයගීතය
(ඉංග්‍රීසි පරිවර්තනය)

Like unto a lotus fully blossomed,
In the pond: The Vidyodaya,
University of Jayewardenepura,
Our meritorious seat of learning,
May your fame spread,
In all ten directions,
With the banner of victory fluttering,
For providing us insight into new technology,
Imbibing the essence thereof,
Distilling the rays of science,
Enabling human endeavour appropriately,
Enhancing skills in management,
And by the grace of Saraswathi,
Fostering sublime qualities and
virtues, We adore you,
Our delightful centre of
wisdom, Like unto a lotus fully
blossomed, In the pond : The
Vidyodaya, University of
Jayewardenepura, Our
meritorious seat of learning,
May your fame spread,
In all ten directions,
With the banner of victory fluttering.

English version by Dr. H A P Abeywardana
The composer of the original in Sinhala

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ජයගීතය
(දෙමළ පරිවර්තනය)

ஐயவர்தனபுர பல்கலைக் கழகம்
பத்ம தடாகத்தில் இலங்கிடும் கமலம் நீ

நம்முயிர் கல்விக் கூடம் நீ
உன் புகழ திக்கெட்டும் பரவ
உன் கொடி உயரப் பறந்திடுமே

நம்முயிர் கல்விக் கூடம் நீ

வளம்பெற வழிசெய் தொழில்நுட்ப ஆற்றல்
அறிவொளி தந்திடும் புதிய விஞ்ஞானம்
மானிட பண்புகள் இனிதே கற்றிட
முகாமைத் திறன்களை விருத்தி செய்திட
சரஸ்வதி அருளால் அறிவினை ஈந்து
ஜெயவழி காட்டிடும் பல்கலைக் கூடம்
தேசத்தின் பெருமையை பரப்பிடும் உனை நாம்
சிரமது தாழ்த்தி வணங்கிடுவோமே

ஐயவர்தனபுர பல்கலைக் கழகம்
பத்ம தடாகத்தில் இலங்கிடும் கமலம் நீ

நம்முயிர் கல்விக் கூடம் நீ
உன்புகழ் திக்கெட்டும் பரவ
உன் கொடி உயரப் பறந்திடுமே
நம்முயிர் கல்விக் கூடம் நீ

ආයතනය සහ විශ්වවිද්‍යාලය




කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය අනුබද්ධව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය වසර **65** කට වඩා පැරණිය. සත්‍ය වශයෙන්ම, යමෙක් උසස් අධ්‍යාපනයේ ආසනයක් ලෙස එහි වසර ගණනාවක දිගු ඉතිහාසය සලකනු ලබන්නේ නම් එය ඊටත් වඩා බොහෝ පැරණි ය. මෙම ආයතනයේ ඉතිහාසය ශත වර්ෂ එකහමාරකට ආසන්න කාලයක් දක්වා එනම් **1873** දී අතිපූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමිපාණන් වහන්සේ විසින් විද්‍යෝදය (දැනුම පිබිදීම යන අරුත) නම් වූ පිරිවෙනක් (බෞද්ධ හා ප්‍රාචීන අධ්‍යයන ආයතනය) ලෙසින් මෙම උසස් අධ්‍යාපනික මධ්‍යස්ථානයට අඩිතාලම දැමූ කාලය දක්වා දිව යයි.

1958 දී එය පාර්ලිමේන්තු පනතක් මගින් ලංකා විද්‍යෝදය විශ්වවිද්‍යාලය ලෙස ප්‍රතිව්‍යවස්ථාගත කරන ලදී. **1978** අංක **16** දරන විශ්වවිද්‍යාල පනත යටතේ, එය ශ්‍රී ලංකාවේ නව පරිපාලන අගනුවර නමින්, 'ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය' ලෙස එය නම් කරන ලදී. මේ වන විට එහි **16,000** කට අධික පූර්ණ කාලීන ශිෂ්‍ය ජනගහනක් මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා, ව්‍යවහාරික විද්‍යා, කළමණාකරන අධ්‍යයන හා වාණිජ විද්‍යා, වෛද්‍ය විද්‍යාව, උපාධි අධ්‍යයන, තාක්ෂණ, ඉංජිනේරු, සම සෞඛ්‍ය විද්‍යා, දන්ත වෛද්‍ය විද්‍යා, නාගරික සහ ජලජ ජෛව සම්පත් සහ පරිගණක පීඨවලට ඇතුළත්ව අධ්‍යාපනය හදාරති.

1978 අංක **16** දරන විශ්වවිද්‍යාල පනත යටතේ **1986** වර්ෂයේ දී ආඥාපනතක් මගින් පිහිටුවන ලද කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතියේ පශ්චාත් උපාධි ආයතන දහය අතුරින් එකකි. එය සාපේක්ෂව පිහිටුවා එතරම් කලක් ගත නොවුණිද , පශ්චාත් උපාධි ආයතන අතරින් විශාලතම ශිෂ්‍ය ගහනය හිමි ආයතනය එය වන අතර එය රටේ විශ්වවිද්‍යාල පද්ධතියේ එකම ස්වයං මූල්‍යයන උසස් අධ්‍යාපන ආයතනය ද වේ.

අපි කවුරුන්ද?



අතිපූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි



අතිපූජ්‍ය වැලිවිටියේ ශ්‍රී සෝරත නාහිමි



ආචාර්ය ගුණපාල නානායක්කාර මහතා

වෛද්‍ය විද්‍යාව, කලා, විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව සහ නීතිය වැනි අනෙකුත් විෂයයන් හා සසඳන විට ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයක් ලෙස කළමනාකරණ අධ්‍යාපනය මෑතක දී බිහි වී ඇත. මෙම ගමන විද්‍යෝදය පිරිවෙන (ප්‍රාචීන ඉගෙනීම සඳහා උසස් අධ්‍යාපන ආයතනයකි) සඳහා 1958 අංක 45 දරන පාර්ලිමේන්තු පනත මගින් විශ්වවිද්‍යාල තත්ත්වය ප්‍රදානය කරමින් 1959 දී ලංකා විද්‍යෝදය විශ්වවිද්‍යාලය පිහිටුවීම සමඟින් ආරම්භ විය. විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ ආරම්භක උපකුලපති අතිපූජ්‍ය වැලිවිටියේ ශ්‍රී සෝරත නායක ස්වාමීන් වහන්සේගේ දූරදර්ශී නායකත්වය යටතේ, ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතියට කළමනාකරණ අධ්‍යාපනය හඳුන්වා දීම ඇතුළුව නව දිශාවන් ඔස්සේ අධ්‍යාපනය පුළුල් කිරීම සඳහා පැහැදිලි පියවර කිහිපයක් ගන්නා ලදී.

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය (PIM) යනු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධ අර්ධ ස්වයං පාලිත ආයතනයකි. කළමනාකරණ සහ පරිපාලන අධ්‍යයන විවිධ අංශවල පශ්චාත් උපාධි උපදෙස්, පුහුණුව, පර්යේෂණ සහ සංවර්ධනය සැපයීම තුළින් ශ්‍රී ලංකාව තුළ කළමනාකරණ අංශයේ උසස් අධ්‍යාපනය සහ වෘත්තීයභාවය ප්‍රවර්ධනය කිරීම එහි අරමුණු වේ. මේ වන විට, එය වෘත්තීය කළමනාකරණ අධ්‍යාපනය සහ පුහුණුවේ ජාතික අවශ්‍යතා සපුරාලීමේ සේවයෙහි නිරතව සිටින අතර, ජ්‍යෙෂ්ඨ මට්ටමේ කළමනාකරුවන් සහ පරිපාලකයින් දහස් ගණනකට ඉගෙනීම සහ කුසලතා සංවර්ධනය සඳහා අභියෝගාත්මක අවස්ථා සපයනු ලබයි. ශ්‍රී ලංකාවේ උසස් කළමනාකරණ අධ්‍යාපනයේ පුරෝගාමියා වන බැවින්, කළමනාකරණ දැනුම නවෝත්පාදනය කිරීමේ සහ ව්‍යාප්ත කිරීමේ ව්‍යාපාරවල නියැලී සිටින අයට සහ උසස් ඉගෙනුම් විකල්ප සොයන අයට කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය විසින් මාර්ගෝපදේශනය සපයනු ලබයි.

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ගමන් මග සිත්ගන්නාසුළු මෙන්ම වැදගත් සිදුවීම්වලින් අනූනය. එය 1981 සැප්තැම්බර් මාසයේදී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ (ගංගොඩවිල, නුගේගොඩ) ශ්‍රී සුමංගල ගොඩනැගිල්ලේ දී ආරම්භ වූයේ කැපවූ ශාස්ත්‍රඥයෙකුගේ (ආචාර්ය ගුණපාල නානායක්කාර) නායකත්වය යටතේය. මෙය කැනඩාවේ ඔටාවා සහ කාල්ටන් විශ්වවිද්‍යාල සමඟ සම්බන්ධක වැඩසටහනක් හරහා පශ්චාත් උපාධි අධ්‍යයන අංශය විසින් ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධි (MBA) / රාජ්‍ය පරිපාලන පශ්චාත් උපාධි (MPA) පාඨමාලා ආරම්භ කිරීම සනිටුහන් කරන ලදී. අධ්‍යයන වැඩසටහන්වල ජනප්‍රියතාවය කෙතරම්ද

යත්, එය 1986 ජනවාරි 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, රටේ උසස් කළමනාකරණ අධ්‍යාපනය සඳහා වන ඉහළම ආයතනය වන කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය (PIM) පිහිටුවීමට හේතු විය. මාස කිහිපයකට පසු, 1986 අප්‍රේල් මාසයේදී, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය (PIM), දෙහිවල (කොළඹට ආසන්නයේ) පිහිටි කුඩා, දෙමහල් ගොඩනැගිල්ලක් වන ස්ටාර් ඉන්ස් හෝටලය වෙත ගෙන යන ලදී. එම ස්ථානයේ එය ඉදිරි වසර දහය තුළ ක්‍රියාත්මක වූ අතර, එහි ක්‍රියාකාරකම් සහ කාර්යසාධනයේ වේගවත් වර්ධනයක් වාර්තා කරන ලදී. 1995 අගභාගයේදී, ඉඩමක් අත්පත් කර ගැනීමෙන් සහ අති නවීන ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීමෙන් අනතුරුව, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය (PIM), කොළඹ 8, ලෙස්ලි රණගල මාවතේ අංක 28 හි පිහිටි තමන්ගේම ගොඩනැගිල්ලක් වෙත ගෙන යන ලදී. එතැන් සිට වසර විසි අටක් ගත වී ඇති අතර, එම කාලය තුළ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය (PIM) භෞතික හා මානව සම්පත්, පිරිනමන සේවාවන්, ප්‍රතිදානය සහ අතිරික්තයන් අනුව වේගයෙන් වර්ධනය වී ඇති අතර, එහි මෙහෙයුම් ශ්‍රී ලංකා වෙරළ තීරයෙන් ඔබ්බට ද විහිදේ.

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය ශ්‍රී ලංකාවේ උසස් කළමනාකරණ අධ්‍යාපන ක්ෂේත්‍රයේ බොහෝ ප්‍රථම අවස්ථාවන් උදා කරගෙන ඇත. පුළුල් පරාසයක ක්‍රියාකාරකම් හරහා ව්‍යාප්තව පවතින මෙම ඉදිරිගාමී ආයතනය, ශාස්ත්‍රීය, කර්මාන්ත, පරිපාලකයින්, ව්‍යවසායකයින්, ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සමස්ත සමාජයටම පහනක්ව බබළන සංවිධානයකි. එය උදා කර ගත් ප්‍රථම අවස්ථාවන් අතර පහත සඳහන් දැ කැපී පෙනේ:

- විදේශීය සහයෝගීතාවයෙන් පිරිනමන පළමු ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධි (MBA) / රාජ්‍ය පරිපාලන පශ්චාත් උපාධි (MPA) පාඨමාලාව* (1981);

- ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධි (MBA) / රාජ්‍ය පරිපාලන පශ්චාත් උපාධි (MPA) පාඨමාලාවේ අනිවාර්ය අංගයක් ලෙස හඳුන්වා දුන් පළමු නේවාසික වැඩමුළුව (1982 සිට);

- ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතියට අයත් උසස් අධ්‍යාපන ආයතනයක් විසින් පවත්වනු ලබන පළමු කළමනාකරණ/විධායක සංවර්ධන වැඩසටහන (1990);

- ශ්‍රී ලංකාවේ පැවැත්වෙන කළමනාකරණ අධ්‍යයනයන් පිළිබඳ පළමු පර්යේෂණ සමුළුව (1992);

- ශ්‍රී ලාංකේය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ප්‍රකාශයට පත් කරන ලද පළමු අධ්‍යයන කාර්ය මණ්ඩල අත්පොත (1994);

- තමන්ගේම ගොඩනැගිල්ලක් ඇති පළමු ශ්‍රී ලාංකික පශ්චාත් උපාධි ආයතනය (1995);

- ශ්‍රී ලංකාවේ දියත් කරන ලද කළමනාකරණ අධ්‍යයනයන් පිළිබඳ පළමු අධ්‍යයන සඟරාව (1996);

- ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතියට අයත් මූල්‍ය ස්වාධීනත්වය භුක්ති විඳින පළමු (සහ එකම) ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතියට අයත් උසස් අධ්‍යාපන ආයතනය (1998 සිට);

- සුනාමියේ ව්‍යසනයේ දී ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘතියක නිරත වූ පළමු ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතියට අයත් උසස් අධ්‍යාපන ආයතනය (2005);

- විදේශීය රටක තම අධ්‍යයන පාඨමාලාව (MBA) පිරිනමන පළමු ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතියට අයත් උසස් අධ්‍යාපන ආයතනය (2007);

- සුපිරි සන්නාමය (2007) සහ ISO 9001: 2008 තත්ත්වය ලබා ගත් පළමු ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතියට අයත් උසස් අධ්‍යාපන ආයතනය **වන අතර**, ඉන්පසු **සුමට** ලෙස ISO 9001:2015 **මට්ටමට මාරු වී ඇත.**;

- වෘත්තීය කේන්ද්‍රීය ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධි පාඨමාලා ආරම්භ කළ පළමු ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතියට අයත් උසස් අධ්‍යාපන ආයතනය [රේගු පරිපාලනය (2009) සහ ජාත්‍යන්තර

වෙළඳාම සහ සැපයුම් (2010)];

- මහා භාණ්ඩාගාරයට තම අතිරික්තයෙන් කොටසක් දායක කරන පළමු ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතියට අයත් උසස් අධ්‍යාපන ආයතනය (2022); සහ,

- වසරේ දින 361 පුරාම විවෘතව තබන පළමු (සහ එකම) ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතියට අයත් උසස් අධ්‍යාපන ආයතනය.

ශ්‍රී ලාංකේය ජීවිතයේ පුද්ගල, සංවිධානාත්මක සහ සමාජීය මට්ටම්වලදී කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය අතිවිශිෂ්ට දායකත්වයක් දක්වා ඇත. කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය මගින් දැනුමෙන් පෝෂණය කරන ලද කළමනාකරුවන් සහ පරිපාලකයින් විශාල සංඛ්‍යාවක් ව්‍යාපාරික නායකයින්, ඉහළ පෙළේ පරිපාලකයින්/කළමනාකරුවන්, ප්‍රතිපත්ති සම්පාදකයින්, විද්‍යාර්ථීන් සහ ව්‍යවසායකයින් ලෙස ඔවුන්ගේ වෘත්තීන්හි නොමැකෙන සලකුණක් තබා ඇත. උපාධි පාඨමාලාවලින් ඇති කරන ලද පරිවර්තනීය වෙනස ඔවුන්ගේ සංවිධාන විශිෂ්ටත්වය කරා ගෙන යාමට ඔවුන්ට හැකි වී ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ආර්ථිකයට සහ සමාජයට ධනාත්මක බලපෑමක් ඇති කර ඇත. තවද, නවීන කළමනාකරණ දැනුම පිළිබඳව පුහුණුව ලත් දෙවන පෙළ කළමනාකරුවන් ඔවුන්ගේ සේවා ස්ථාන සංවර්ධනයට විශාල දායකත්වයක් ලබා දී ඇත. වෙනම නමුත් වැදගත් ක්ෂේත්‍රයක, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ පර්යේෂණ කටයුතු, උපදේශන සේවා සහ ප්‍රකාශන, ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටක කළමනාකරණ පිළිවෙත් පිළිබඳ දැනුම පුළුල් කිරීමට උපකාරී වී තිබේ. තවද, එහි ව්‍යවස්ථාපිත වගකීම්වලට අමතරව, බලපෑම් සහිත ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘති රාශියක් හරහා කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය, වරප්‍රසාද නොලත් සහ අගතියට පත් අයට සහාය වී ඇත. මූල්‍යමය වශයෙන් ස්වාධීන ආයතනයක් වීම ගැන ද අවශ්‍ය විටෙක රජයේ අරමුදල්වලට පවා දායක වීම පිළිබඳවද කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය අභිමානයෙන් පසුවේ. සියල්ලටත් වඩා, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය රටේ අනෙකුත් විශ්වවිද්‍යාල සඳහා අනුගමනය කළ යුතු ආදර්ශයක් වේ.

* *ශ්‍රී ලංකාවේ ප්‍රථම ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධි (*MBA) / *රාජ්‍ය පරිපාලන පශ්චාත් උපාධි (*MPA) *පාඨමාලාව පිරිනැමීමේ ගෞරවය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට හිමිවේ.* 1968 *දී ආරම්භ කරන ලද මෙම පාඨමාලාව වසර හතකට පසු* 1975 *දී අවසන් කරන ලදී.*

පාලනය

ආයතනයේ පාලන මණ්ඩලය

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය යනු 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24අ වගන්තියේ විධිවිධාන යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විමසා, උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයා ලෙස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිගරු ජනාධිපතිතුමන් විසින් කරන ලද නියෝගයක් මගින් 1986 ජනවාරි 1වන දින නීත්‍යානුකූලව පිහිටුවන ලද ආයතනයකි. මෙම නියෝගය 1985 දෙසැම්බර් 24වන දින අංක 381/5 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර ඇත.

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ බලතල සහ කාර්යයන්, එහි බලධාරීන් සහ ඒවායේ සංයුතිය, රාජකාරි සහ කාර්යයන් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් ගැසට් කර අනුමත කරන ලද කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ නියමාවලියෙහි දක්වා ඇත. කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ක්‍රියාත්මක වන වත්මන් නියමාවලිය වන්නේ 2018 අංක 03 දරන නියමාවලියයි. මෙමගින් පෙර 1985 අංක 3 දරන නියමාවලිය සහ 1996 අංක 7 දරන නියමාවලිය අවලංගු කර ඇත. අලෙවිකරණය, මානව සම්පත් කළමනාකරණය, මූල්‍ය, උපායමාර්ගික කළමනාකරණය සහ රාජ්‍ය පරිපාලනය ඇතුළු විවිධ කළමනාකරණ අංශවල සිසුන් බඳවා ගැනීමට සහ පශ්චාත් උපාධි අධ්‍යාපනය ලබා දීමට කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයට එහි නියමාවලිය මගින් බලය පවරා ඇත. කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය විසින් පිරිනමනු ලබන පශ්චාත් උපාධි පාඨමාලා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ සහ පාලක සභාවේ නිර්දේශය මත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් අනුමත කළ යුතුය.

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය තම ක්‍රියාකාරකම් පිළිබඳ වාර්ෂික වාර්තාවක් සකස් කරයි. වාර්ෂික ගිණුම් ප්‍රකාශය ශ්‍රී ලංකා විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලැබේ. වාර්ෂික වාර්තාව සහ විගණකාධිපතිවරයාගේ වාර්තාව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය. කළමනාකරණ මණ්ඩලය ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට වගකිව යුතුය. පැහැදිලි කිරීම් ලබා ගැනීමට සහ උපදෙස් ලබා දීම පිණිස කළමනාකරණ මණ්ඩලය පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කමිටුවට (COPE) කැඳවිය හැකිය. එබැවින්, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ සමස්ත කාර්ය සාධනය ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් නිරීක්ෂණය කරනු ලැබේ.

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය තුළ, උපායමාර්ගික සැලැස්මේ දක්වා ඇති එක් එක් අරමුණ සහ උපාය මාර්ගය සඳහා, ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI) සහ වගකිවයුතු පුද්ගලයින් හඳුනා ගනු ලැබේ. උපායමාර්ගික සැලැස්ම මත පදනම්ව වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් සකස් කරනු ලබන අතර එක් එක් උපාය මාර්ගය යටතේ සිදු කළ යුතු ප්‍රධාන ක්‍රියාකාරකම් ලැයිස්තුගත කර ඇත. එක් එක් ක්‍රියාකාරකම සඳහා ප්‍රධාන කාර්යසාධන දර්ශක සහ එක් එක් උපායමාර්ගික ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු පුද්ගලයා ද හඳුනා ගනු ලැබේ. මෙම ප්‍රධාන කාර්යසාධන දර්ශකවල ජයග්‍රහණ අධ්‍යක්ෂවරයා විසින් නිරීක්ෂණය කරනු ලබන අතර කළමනාකරණ මණ්ඩලයට නිතිපතා වාර්තා කරනු ලැබේ. ඇතැම් මෙහෙයුම් කරුණු සම්බන්ධයෙන් තීරණ ගනු ලබන්නේ අධ්‍යක්ෂවරයා, ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරයා, නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරයා, තත්ත්ව සහතික කිරීමේ සහ ප්‍රතීතන මධ්‍යස්ථානයේ ප්‍රධානියා සහ ජ්‍යෙෂ්ඨ පීඨ සාමාජිකයින් සිව්දෙනෙකුගෙන් සමන්විත කළමනාකරණ කමිටුව විසිනි.

පර්යේෂණ සම්බන්ධ මෙහෙයුම් කටයුතු පර්යේෂණ උපදේශක කමිටුව විසින් සපයනු ලබන මගපෙන්වීම යටතේ පර්යේෂණ සම්බන්ධීකාරක විසින් සිදු කරනු ලබන අතර, එම කමිටුව අධ්‍යක්ෂ, පර්යේෂණ සම්බන්ධීකාරක, තත්ත්ව සහතික සහ ප්‍රතීතන මධ්‍යස්ථානයේ ප්‍රධානියා, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපති සහ කළමනාකරණ මණ්ඩලයේ නාමිකයෙකුගෙන් සමන්විත වේ.

තත්ත්ව සහතිකකරණ ක්‍රියාකාරකම් සිදු කරනු ලබන්නේ තත්ත්ව සහතිකකරණ සහ ප්‍රතීතන මධ්‍යස්ථානය විසිනි. මෙහෙයුම් කණ්ඩායම වන්නේ තත්ත්ව සහතිකකරණ සහ ප්‍රතීතන මධ්‍යස්ථානයේ කමිටුව වන අතර, එහි අධ්‍යක්ෂ, තත්ත්ව සහතිකකරණ සහ ප්‍රතීතන මධ්‍යස්ථානයේ ප්‍රධානියා, පාඨමාලා සම්බන්ධීකාරකවරුන්, පර්යේෂණ සම්බන්ධීකාරක, ISO සම්බන්ධීකාරක, සහකාර පුස්තකාලයාධිපති, ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරු/තොරතුරු තාක්ෂණ යන අයගෙන් සමන්විත වේ. මෙම කමිටුවේ මාසික රැස්වීම්වලදී සියලුම තත්ත්ව සහතිකකරණ සහ ප්‍රතීතන ක්‍රියාකාරකම් සාකච්ඡා කර අවශ්‍ය තීරණ ගනු ලැබේ. ඇතැම් තීරණ අනුමැතිය සඳහා කළමනාකරණ මණ්ඩලයට සහ/හෝ අධ්‍යයන මණ්ඩලයට වාර්තා කරනු ලැබේ.

පුස්තකාලයේ මෙහෙයුම් කටයුතු අධ්‍යක්ෂවරයාට සෘජුවම වාර්තා කරනු ලබන සහකාර පුස්තකාලයාධිපතිවරයා විසින් සිදු කරනු ලැබේ. පුස්තකාලයේ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය තත්ත්ව සහතිකකරණ සහ ප්‍රතීතන මධ්‍යස්ථානයේ කමිටු රැස්වීමේදී සාකච්ඡා කර අවශ්‍ය මග පෙන්වීම ලබා දෙනු ලැබේ.

මෙම කමිටුවලදී ගනු ලබන අධ්‍යයන කටයුතු පිළිබඳ තීරණ පීඨ රැස්වීම්වලදී පීඨයට දැනුම් දෙනු ලැබේ. මෙම රැස්වීම්වලදී පීඨ සාමාජිකයින් විසින් දක්වන ලද අදහස් මෙහෙයුම් කටයුතුවලදී නිසි ලෙස සලකා බලනු ලැබේ.

කළමනාකරණ මණ්ඩලය

ආයතනයේ අධ්‍යයන හා විධායක ආයතනය වන වත්මන් කළමනාකරණ මණ්ඩලය පහත පරිදි වේ.:

ආචාර්ය කැලුම් ගමගේ මහතා (සභාපති) 2024 මැයි 7වන දින දක්වා කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ (PIM) අධ්‍යක්ෂවරයා ලෙස සේවය කරන ලදී. ඔහු කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු වන අතර මීට පෙර ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරක් දැරීය. ආචාර්ය ගමගේ ඔහුගේ අධ්‍යයන නායකත්වය සහ කළමනාකරණ පශ්චාත් උපාධි අධ්‍යාපනය සහ පර්යේෂණ සඳහා කළ දායකත්වය වෙනුවෙන් පිළිගැනීමට ලක්ව ඇත

ආචාර්ය අසංග රණසිංහ මහතා (සභාපති) 2024 මැයි 8වන දින සිට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ (PIM) අධ්‍යක්ෂවරයා ලෙස සේවය කර ඇති අතර ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ හිටපු සභාපතිවරයා ද වේ. කර්මාන්ත හා අධ්‍යාපන ක්ෂේත්‍රවල වසර 30කට අධික අත්දැකීම් ඇති ඔහු, FMCG, LPG, ඉන්ධන, මෝටර් රථ, කෘෂිකර්ම සහ නවීන සිල්ලර වාණිජ ක්ෂේත්‍රවල ජ්‍යෝෂ්ඨ තනතුරු දරා ඇති අතර, ආයතනික ක්‍රමෝපාය, අළෙවිකරණය, සැපයුම් දාමය, සහ පර්යේෂණ හා සංවර්ධන ක්ෂේත්‍රවල විශේෂඥතාවය පෙන්නුම් කරයි. කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ (PIM) ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු ලෙස දශකයකට ආසන්න පශ්චාත් උපාධි ඉගැන්වීම් කටයුතු සිදු කරනු ලබන ආචාර්ය රණසිංහ, රසායන විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධියක්, අළෙවිකරණය සහ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම් සහ පාරිභෝගික අළෙවිකරණය පිළිබඳ ආචාර්ය උපාධියක් ලබා ඇත. ඔහු උපායමාර්ගික නායකත්වය, පර්යේෂණ ප්‍රකාශන සහ කළමනාකරණය සහ අළෙවිකරණයේ වෘත්තීය සංවර්ධනය සඳහා වූ දායකත්වය වෙනුවෙන් පුළුල් ලෙස පිළිගැනීමට ලක්ව ඇත.

ටී. එම්. ජේ. බණ්ඩාර මහතා මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස කටයුතු කරයි. රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය, පාලනය සහ රාජ්‍ය ව්‍යවසාය අධීක්ෂණය පිළිබඳ පුළුල් විශේෂඥතාවක් ඔහු සතුවේ. මූල්‍ය විනය වැඩි දියුණු කරන සහ රජය සතු ව්‍යවසායන්හි කාර්යසාධනය වැඩි දියුණු කරන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී බණ්ඩාර මහතා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි.

ආචාර්ය හර්ෂ කබ්රාල් මහතා සමාගම්, වාණිජ, බුද්ධිමය දේපළ සහ ජාත්‍යන්තර වෙළඳ නීතිය පිළිබඳ වසර 37කට අධික පළපුරුද්දක් ඇති ජනාධිපති නීතිඥවරයෙකි. ඔහු කැන්බරා විශ්වවිද්‍යාලයෙන් ආයතනික නීතිය පිළිබඳ ආචාර්ය උපාධියක් ලබා ඇති අතර 2007 අංක 7 දරන ශ්‍රී ලංකාවේ සමාගම් පනතේ ප්‍රධාන නිර්මාතෘවරයෙකි. ආචාර්ය කබ්රාල් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සහ ටෝකියෝ සිමෙන්ති සමූහයේ සභාපති ලෙස සේවය කරන අතර බොහෝ ආයතනික මණ්ඩල සහ ජාතික නීති කොමිෂන් සභාවල සාමාජිකත්වය දරයි. පැරිසියේ ICC බේරුම්කරණ අධිකරණයේ හිටපු සාමාජිකයෙකු වන ඔහු ජ්‍යෙෂ්ඨ බාහිර පීඨ සාමාජිකයෙකු සහ ආයතනික සහ බේරුම්කරණ නීතිය පිළිබඳ පුළුල් ලෙස ප්‍රකාශයට පත් කරන ලද කතුවරයෙකි.

රවී ජයවර්ධන මහතා මැලිබන් බිස්කට් නිෂ්පාදන (පුද්ගලික) සමාගමේ සමූහ ප්‍රධාන විධායක නිලධාරියා වන අතර, එහිදී ඔහු සමාගමේ උපායමාර්ගික වර්ධනය සහ ගෝලීය වෙළඳපල ව්‍යාප්තිය මෙහෙයවයි. ආයතනික නායකත්වය සහ සන්නාම කළමනාකරණය පිළිබඳ පුළුල් අත්දැකීම් ඇති ඔහු, වේගයෙන් අළෙවි වන පාරිභෝගික භාණ්ඩ අංශයේ නවෝත්පාදන සහ මෙහෙයුම් විශිෂ්ටත්වය මෙහෙයවා ඇත. ජයවර්ධන මහතා කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ බාහිර පීඨ සාමාජිකයෙකු ලෙසද සේවය කරන අතර, නැගී එන ව්‍යාපාරික නායකයින් සමඟ තම කර්මාන්ත විශේෂඥතාව බෙදා ගනී.

මහාචාර්ය දුෂාන් ජයවික්‍රම මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨයේ පීඨාධිපතිවරයා වේ. පළපුරුදු විද්‍යාර්ථීයෙකු සහ පර්යේෂකයෙකු වන ඔහු කළමනාකරණ අධ්‍යාපනය සහ විෂයමාලා සංවර්ධනය සඳහා පුළුල් දායකත්වයක් ලබා දී ඇත. මහාචාර්ය ජයවික්‍රම මහතා කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ බාහිර පීඨ සාමාජිකයෙකු

ලෙස ද සේවය කරන අතර, එහිදී ඔහු කළමනාකරණය සහ නායකත්වය පිළිබඳ තම විශේෂඥතාව පශ්චාත් උපාධි සිසුන් සමඟ බෙදා ගනී.

තිලකා ජයසුන්දර මහත්මිය අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරිය වන අතර, ඇය ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති සහ පරිපාලනය සඳහා නායකත්වය සපයයි. මහා පරිමාණ අධ්‍යාපනික සහ වෘත්තීය මූලපිරීම් කළමනාකරණය කිරීමේ දී ඇය පුළුල් රාජ්‍ය අංශයේ අත්දැකීම් ගෙන එයි. කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ආදි ශිෂ්‍යාවක් වන ජයසුන්දර මහත්මිය රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක් (MPA) ලබා ඇති අතර ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය ඉදිරියට ගෙන යාම සඳහා ඇයගේ කැපවීම වෙනුවෙන් පිළිගැනීමට ලක්ව ඇත.

මහාචාර්ය නිල්මිණි ලියනගේ මහත්මිය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ පීඨාධිපතිනියයි. ඇය තාක්ෂණ අධ්‍යාපනය සහ අන්තර් විෂයයික නවෝත්පාදනයන් දියුණු කිරීම සම්බන්ධයෙන් පුළුල් අත්දැකීම් ඇති දක්ෂ අධ්‍යයන හා පර්යේෂිකාවක වේ. මහාචාර්ය ලියනගේ මිය පීඨයට උපායමාර්ගික නායකත්වය සපයන අතර අති නවීන අධ්‍යයන පාඨමාලා සහ පර්යේෂණ මූලපිරීම් සංවර්ධනය කිරීමේ දී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරන්නීය.

ආචාර්ය රවී ලියනගේ මහතා රයිගම් මාර්කටින් සර්විසස් (පුද්) සමාගමේ සභාපතිවරයා වන අතර, සමාගමේ උපායමාර්ගික වර්ධනය සහ වෙළඳපල සංවර්ධනය සඳහා නායකත්වය ලබා දෙයි. ව්‍යාපාර කළමනාකරණය සහ අලෙවිකරණය පිළිබඳ පුළුල් අත්දැකීම් ඇති ඔහු රයිගම් සන්නාමය ගොඩනැගීමට සහ FMCG අංශයේ එහි පැවැත්ම පුළුල් කිරීමට දායක වී ඇත. ආචාර්ය ලියනගේ මහතා ඔහුගේ ව්‍යවසායක දැක්ම සහ ශ්‍රී ලංකාවේ පාරිභෝගික භාණ්ඩ කර්මාන්තයට දැක්වූ දායකත්වය වෙනුවෙන් පිළිගැනීමට ලක්ව ඇත.

මහාචාර්ය රසික පෙරේරා මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපතිවරයා වේ. කීර්තිමත් විද්‍යාර්ථියෙකු හා පර්යේෂකයෙකු වන ඔහු පශ්චාත් උපාධි අධ්‍යාපනය සහ අන්තර් විෂයයික පර්යේෂණ සඳහා උපායමාර්ගික නායකත්වය සපයයි. මහාචාර්ය පෙරේරා මහතා උපාධි මට්ටමේ අධ්‍යයනයන් ප්‍රවර්ධනය කිරීම සහ විවිධ අධ්‍යයන ක්ෂේත්‍ර හරහා නවෝත්පාදනයන් පෝෂණය කිරීම වෙනුවෙන් පිළිගැනීමට ලක්ව ඇත.

දීපාල් සූරියආරච්චි මහතා AIA සමූහයේ විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වන අතර රක්ෂණ සහ මූල්‍ය සේවා අංශවල පුළුල් අත්දැකීම් ඇති ගෞරවනීය ව්‍යාපාරික නායකයෙකි. උපායමාර්ගික කළමනාකරණය, අලෙවිකරණය සහ නායකත්ව සංවර්ධනය පිළිබඳ ප්‍රවීණත්වය සඳහා ඔහු ප්‍රසිද්ධය. සූරියආරච්චි මහතා ආයතනික නායකත්වය සහ පුද්ගලික සංවර්ධනය සඳහා ඔහුගේ දායකත්වය සඳහා පුළුල් ලෙස පිළිගැනීමට ලක්වන දක්ෂ කතුවරයෙකු සහ කථිකයෙකු ද වේ.

ලලිත් වීරතුංග මහතා ශ්‍රී ලංකාවේ හිටපු ජනාධිපති ලේකම්වරයා වන අතර, ප්‍රතිපත්ති සම්පාදනය සහ ජාතික පරිපාලනය පිළිබඳ දශක ගණනාවක ජ්‍යෙෂ්ඨ රාජ්‍ය සේවා අත්දැකීම් ඔහු සතුව ඇත. රජයේ ඉහළම මට්ටම්වල පාලන ප්‍රතිසංස්කරණ සහ උපායමාර්ගික සංවර්ධන ප්‍රයත්නයන්හි දී ඔහු ප්‍රධාන කාර්යභාරයක් ඉටු කර ඇත. රාජ්‍ය පරිපාලනය සහ නායකත්වය පිළිබඳ තම ප්‍රවීණත්වය බෙදා ගනිමින්, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ බාහිර පීඨ සාමාජිකයෙකු ලෙස ද වීරතුංග මහතා සේවය කරයි.

කමල් රෝහිත උඩුවාවල මහතා පරිසර අමාත්‍යාංශයේ ලේකම්වරයා වන අතර, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකි. ඔහු "සරල ඩිජිටල් ඉලෙක්ට්‍රොනික ඡන්ද කවුන්ටරයක්" (1997) සඳහා පේටන්ට් බලපත්‍රයක් හිමිකරගෙන ඇති අතර ඖෂධ රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් සහ අධ්‍යාපන; රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන; සහ උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන යන අමාත්‍යාංශවල අතිරේක ලේකම් ඇතුළු ප්‍රධාන පරිපාලන තනතුරු කිහිපයක සේවය කර ඇත. ඔහු ප්‍රතීතනය සහ තත්ත්ව සහතික කිරීම පිළිබඳ ස්ථාවර කමිටුවේ (2018–2019) සභාපතිවරයා ලෙස සහ මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස ද සේවය කර ඇත.

අධ්‍යයන මණ්ඩලය

ආයතනයේ ව්‍යාපාර පරිපාලන අධ්‍යයන මණ්ඩලය සහ රාජ්‍ය පරිපාලන අධ්‍යයන මණ්ඩලය විසින් වසර තුළ ඉගැන්වීම, විභාග සහ පර්යේෂණ සම්බන්ධ කරුණු නියාමනය කරන ලද අතර, පහත සඳහන් සාමාජිකයින්යෝ මෙම මණ්ඩල නියෝජනය කළහ.

ආචාර්ය අසංග රණසිංහ මහතා (සභාපති)
අධ්‍යක්ෂ, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අජන්ත ධර්මසිරි මහතා
සම්බන්ධීකාරක, ව්‍යාපාර පරිපාලනය පිළිබඳ දර්ශන විශාරද උපාධි (DBA පාඨමාලාව),
කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය

ආචාර්ය රවී ප්‍රනාන්දු මහතා
සභාපති, ගෝලීය ආයතනික උපායමාර්ගික තිරසාරභාවය

වෛද්‍ය අනිල් ජාසිංහ මහතා
ලේකම්, පරිසර අමාත්‍යාංශය

ආචාර්ය ඒ කේ එල් ජයවර්ධන මහතා
සම්බන්ධීකාරක, පර්යේෂණ, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය

මහාචාර්ය දුෂාන් ජයවික්‍රම
පීඨාධිපති, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

ආචාර්ය ට්‍රෙවර් මෙන්ඩිස් මහතා
සම්බන්ධීකාරක, ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විධායක පශ්චාත් උපාධි (EMBA) වැඩසටහන,
කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පත්මලාල් මානගේ මහතා
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපති

ආචාර්ය ට්‍රැවිස් පෙරේරා මහතා
සම්බන්ධීකාරක, ආචාර්ය උපාධි වැඩසටහන, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය


මහාචාර්ය ජයන්ත රත්නසේකර මහතා
උපකුලපති, ICST විශ්ව විද්‍යාලය

ආචාර්ය ආර්. එච්. එස්. සමරතුංග මහතා
ජනාධිපතිවරයාගේ ජ්‍යෙෂ්ඨ ආර්ථික උපදේශක

ආචාර්ය අරුල් සිවගනනාදන් මහතා
හේලීස් බිස්නස් සොලියුෂන්ස් ඉන්ටර්නැෂනල් (පුද්) සමාගමේ හිටපු ප්‍රධාන විධායක නිලධාරී

ලලිත් වීරතුංග මහතා
අතිගරු ජනාධිපතිතුමන්ගේ හිටපු ලේකම්

සංවිධාන සටහන


ORGANIZATIONAL STRUCTURE
Board of Management
Vice Chancellor
Audit and Management Committee
Finance Committee
Board of Study
Director
Teaching Staff
Fulltime
Visiting
Programme Coordinators
PhD
DBA
MBA
EMBA
MPAEM
MBAT
MBACIT
PDM
CQA
SAR (AA)
Supportive Staff
SAR
Supportive Staff
DB
Supportive Staff
Assist. Librarian
Supportive Staff
Systems Analyst
PRO

ආයතනයේ ශක්තිය

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය අදාළ ක්ෂේත්‍රයන්හි කීර්තිමත් ප්‍රවීණයන්ගෙන් සමන්විත වන අතර, ඔවුන් පන්ති කාමරයට දැනුම හා අත්දැකීම් සම්භාරයක් ගෙන එනු ලබයි. උපදේශකත්වය සහ මග පෙන්වීම සඳහා කැපවීමක් ඇතිව, අපගේ පීඨය මගින් ඉගෙනුම් හවුල්කරුවන් ඔවුන්ගේ පර්යේෂණ සහ ඉගෙනුම් උත්සාහයන්හි සීමාවන් අභිභවා යෑමට දිරිමත් කරන සහයෝගී ඉගෙනුම් පරිසරයක් පෝෂණය කරනු ලබයි. එක් එක් සිසුවා සඳහා පෞද්ගලික උපදේශන, සහයෝගීතා ව්‍යාපෘති සහ අන්තර් විෂය සම්මන්ත්‍රණ හරහා, අප පීඨය සිසුන්ගේ අධ්‍යයන ගමන හැඩගැස්වීමෙහි ලා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන අතර ඔවුන් ඔවුන්ගේ අදාළ ක්ෂේත්‍රවල සොයනු ලබන නායකයින් ලෙස මතුවීම සහතික කරනු ලබයි.

වර්තමානයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය විසින් පිරිනමනු ලබන පාඨමාලා පහත පරිදි වේ.:

- දර්ශන විශාරද උපාධිය (Ph. D) ‘
- ‘ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ආචාර්ය උපාධිය (DBA)
- ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය (MBA)*
- අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ රාජ්‍ය පරිපාලන පශ්චාත් උපාධිය (MPA)
- රේගු සහ ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධිය (MBA-CIT)
- අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ රාජ්‍ය පරිපාලන පශ්චාත් උපාධිය (MPA-EM)**
- බදුකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධිය (MBA-T)
- ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විධායක පශ්චාත් උපාධිය (EMBA)***
- කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (PDM)

** ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය (MBA) එක්සත් අරාබි එමීර් රාජ්‍යය, කටාර්, කුවේට්, ඕමානය සහ බහරේන් යන රටවල පිරිනමනු ලැබේ.*

***2024 සිට කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය චීන සිසුන්ට අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ රාජ්‍ය පරිපාලන පශ්චාත් උපාධිය (MPA-EM) පාඨමාලාව පිරිනැමීම ආරම්භ කර ඇත.*

****2023 සිට කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය චීන සිසුන්ට ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විධායක පශ්චාත් උපාධි (EMBA) පාඨමාලාව පිරිනැමීම ආරම්භ කර ඇත.*

ආයතනයේ ආයතනික පාලනය

1978 අංක 16 දරන පාර්ලිමේන්තු පනතක් මගින් ලබා දී ඇති ස්වයං පාලන මට්ටමක් සහිත කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය, රාජ්‍ය ආයතනයක් ලෙස ඉහළ පාලන ප්‍රමිතීන් පවත්වා ගනී. කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ පාලන ව්‍යුහය, ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සකස් කර ඇත්තේ විශ්වවිද්‍යාල පාලන ව්‍යුහයට අනුකූලව අනිවාර්ය සහ ස්වේච්ඡා රාමු කටයුතුවලට අනුකූලවය.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 'ව්‍යාපාර පාසල' ලෙස ක්‍රියා කරන කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය කළමනාකරණය කරනු ලබන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් ආයතනයට මහ පෙන්වීම සඳහා පත් කරන ලද කළමනාකරණ මණ්ඩලයේ (BOM) සාමාජිකයින් විසිනි. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පීඨ තුනක පීඨාධිපතිවරුන් තිදෙනෙකු, භාණ්ඩාගාර නිලධාරියෙකු සහ අධ්‍යාපන අමාත්‍යාංශ නිලධාරියෙකුගෙන් සමන්විත කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින් ආයතනික ලෝකය නියෝජනය කරයි. සියලුම අධ්‍යයන පාඨමාලා සඳහා මහ පෙන්වීම සහ විෂය පරාසය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අධ්‍යයන මණ්ඩල සාමාජිකයින් පත් කරනු ලැබේ. අධ්‍යයන මණ්ඩල සාමාජිකයින්ට විශ්වවිද්‍යාල මහාචාර්යවරුන්, ආයතනික ලෝකයේ විද්‍යාර්ථීන් සහ විවිධ අධ්‍යයන වැඩසටහන් නියෝජනය කරන ජ්‍යෙෂ්ඨ පීඨ සාමාජිකයින් කිහිප දෙනෙකුගේ එකතුවක් ද ඇතුළත් වේ.

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතන පනත ප්‍රකාරව, සියලුම මූල්‍ය කළමනාකරණ ක්‍රියාකාරකම් භාණ්ඩාගාර චක්‍රලේඛ මත පදනම්ව රාජ්‍ය විගණනයේ දැඩි පරීක්ෂාවට ලක් වේ. ඊට අමතරව, කළමනාකරණ මණ්ඩලයේ උප කමිටු වන මූල්‍ය කමිටුව සහ විගණන කමිටුව, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය කළමනාකරණය සමීපව නිරීක්ෂණය කර රෙගුලාසි වලට අනුව කළමනාකරණ මණ්ඩලයට වාර්තා කරයි. කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා කලින් තීරණය කරන ලද න්‍යාය පත්‍රයක් මත කළමනාකරණ මණ්ඩලය නිතිපතා රැස්වේ. අධ්‍යයන මණ්ඩලය ද අවශ්‍ය විටෙක රැස්වන අතර, අධ්‍යයන කරුණු සාකච්ඡා කිරීම සඳහා වසරකට අවම වශයෙන් රැස්වීම් වාර හතරක් පවත්වන අතර, එවැනි රැස්වීම් වාර්තා අවශ්‍ය අනුමත කිරීම් සඳහා කළමනාකරණ මණ්ඩලයට යොමු කෙරේ.

වෙනස් දෘෂ්ටිකෝණයකින්, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය, ගෝලීය වෙනස්කම් සමඟ සමපාත වන පරිදි උපායමාර්ගික සැලසුම් කිරීම, වෙළඳපල තොරතුරු රැස් කිරීම සහ ඉගැන්වීමේ ක්‍රම වැඩිදියුණු කිරීමේදී - ආදි සිසුන්, ආයතනික අංශය සහ අනෙකුත් හවුල්කරුවන් මෙන්ම භාණ්ඩාගාරය, අධ්‍යාපන අමාත්‍යාංශය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) ඇතුළු සියලුම ප්‍රධාන කොටස්කරුවන් සම්බන්ධ කරයි. එබැවින්, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය එහි පාලන ව්‍යුහය, නියාමන රාමුව සහ කොටස්කරුවන්ගේ කළමනාකරණ ක්‍රියාවලිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කර ඇත.

අවදානම් කළමනාකරණය


නවීන ව්‍යාපාරික පාසලක් ලෙස අධ්‍යාපනය ඵලදායී ලෙස ලබා දීම සඳහා අවදානම් තක්සේරු කිරීම සහ අඩු කිරීම ඉතා වැදගත් බව කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය විශ්වාස කරනු ලබයි. එබැවින්, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය නිතිපතා වෙළඳපල තොරතුරු, එහි පවතින වැඩසටහන් සහ මූල්‍ය අවදානම, කළමනාකරණ අවදානම, වෙළඳපල අවදානම, කීර්ති නාම අවදානම, රට ආශ්‍රිත අවදානම්, විනිමය අනුපාත අවදානම සහ ගෝලීය අවදානම් වැනි විවිධ අවදානම් ඇගයීමට ලක් කරයි.

විදේශ වෙළෙඳපොළ තුළ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය (MBA) ක්‍රියාත්මක කිරීම සහ එවැනි වෙළෙඳපොළවලින් විදේශ මුදල්වලින් ගෙවීම් ලබා ගැනීම හේතුවෙන්, විදේශ විනිමය උච්චාවචනයන්හි අස්ථාවරත්වය, සාර්ව ආර්ථික පසුබෑම් සහ අස්ථාවරත්වයේ මට්ටම හේතුවෙන්, රුපියල් මුදල් ප්‍රවාහ සඳහා පමණක් නොව, ගෙවීම් ද්වාර හරහා විදේශ මුදල් ලැබීම් සඳහා වන අවදානම් තක්සේරුව සමීපව නිරීක්ෂණය කරනු ලැබේ. නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරයා සහ අධ්‍යක්ෂවරයා මූල්‍ය අවදානම සමීපව තක්සේරු කර ඒ අනුව පියවර ගනී. මෑතකදී පත් කරන ලද අධ්‍යක්ෂවරයා විසින් ගනු ලැබූ ඵලදායී ක්‍රියාමාර්ගය හේතුවෙන්, ආයතනය විසින් අත්විඳි මෙහෙයුම් පාඩු මේ වන විට අවම වී ඇති අතර, අවදානම් තක්සේරුව සඳහා ධනාත්මක ප්‍රවේශය පමණක් නොව, හඳුනාගත් මූල්‍ය අවදානම් කඩිනම් ක්‍රියාමාර්ග සමඟ අවම කරන ආකාරය ද ප්‍රමාණවත් ලෙස පෙන්නුම් කරයි.

මැයි 8වන දින නව අධ්‍යක්ෂවරයා පත් කිරීමත් සමඟ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ සුමට නායකත්ව සංක්‍රාන්තියක් සිදු විය. මෙය ඉදිරි වසර තුන සඳහා ස්ථාවර කළමනාකරණයක් සහතික කරයි. කෙසේ වෙතත්, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ අනාගත ප්‍රගතියට බාහිර සාධක කිහිපයක් අභියෝග එල්ල කරයි. මේවාට රටේ වත්මන් අස්ථාවරත්වය, ඉදිරි මැතිවරණ, බුද්ධි ගලනය, මූල්‍ය අස්ථාවරත්වය සහ අඩු මිලදී ගැනීමේ ශක්තිය ඇතුළත් වේ. මෙම සාධක නව පාඨමාලාවන්හි සාර්ථකත්වයට, ආදායම් උත්පාදනයට සහ සමස්ත ආර්ථික තිරසාරභාවයට බලපෑ හැකිය. වසර 38 ක ආඩම්බර ඉතිහාසයක් ඇති කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය මේ වන විට බොහෝ අභියෝගවලට මුහුණ දෙනු ලබයි. අධ්‍යාපන අංශයේ නියාමනය නොකළ ස්වභාවය සහ විවිධ පශ්චාත් උපාධි පාඨමාලා පිරිනමනු ලබන පිළිගැනීමක් නොමැති සහ තාවකාලික ආයතනවල වේගවත් වැඩිවීම ඒ අතර වේ. මෙම වර්ධනයන් කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ අඛණ්ඩ සාර්ථකත්වය සඳහා ඉහළ වෙළඳපල අවදානමක් සහ දැඩි තරඟකාරිත්වයක් ඇති කරයි.ඊට අමතරව, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය සිය ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධි පාඨමාලා බොහොමයක් දැනට පිරිනමනු ලබන කලාපයක් වන මැද පෙරදිග යුද්ධයක හැකියාව හේතුවෙන් විභව්‍ය ගෝලීය අවදානමක් ද දකී.

අප පාර්ශ්වකරුවන් සඳහා වටිනාකමක් නිර්මාණය කරන ආකාරය

ආයතනයේ උපායමාර්ගික අනාගත දිශාව: කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ විශිෂ්ටත්වයේ පදනම



වටිනාකම් අභිප්‍රේරකය 1 – නව්‍ය ඉගැන්වීම හා ඉගෙනුම	සියලුම අධ්‍යයන වැඩසටහන් වලදී ලොව පිළිගත් ඉගැන්වීමේ සහ ඉගෙනුම් අත්දැකීමක් ලබා දීම.
වටිනාකම් අභිප්‍රේරකය 2 – ගැඹුරු අවබෝධයක් සහිත සහ අදාළ පර්යේෂණ සහ ප්‍රකාශන	කර්මාන්ත අවශ්‍යතා සමඟ යෝග්‍ය, අදාළ සහ කාලෝචිත වන පරිදි PIM පර්යේෂණ සහ ප්‍රකාශනවල විෂය පථය වැඩි දියුණු කිරීම.
වටිනාකම් අභිප්‍රේරකය3 – සහයෝගීතා සහ හවුල්කාරිත්වයන් සාරවත් කිරීම	කර්මාන්ත, උසස් අධ්‍යාපන ආයතන සහ වෘත්තීය සංගම් සමඟ සහයෝගී හවුල්කාරිත්වයන් වර්ධනය කිරීම.
වටිනාකම් අභිප්‍රේරකය 4 –අනාගත ධාරිතා ගොඩනැගීම සහ නායකත්ව සංවර්ධනය	පෞද්ගලික සහ රාජ්‍ය අංශයේ සංවිධාන සඳහා ධාරිතා වර්ධනය සහ නායකත්ව සංවර්ධනය සඳහා නායකත්වය දීම.

වටිනාකම් අභිප්‍රේරකය (Value Driver) 1 – නව්‍ය ඉගැන්වීම හා ඉගෙනුම

ප්‍රතිපත්තිය යනු තීරණ මෙහෙයවීම සහ තාර්කික ප්‍රතිඵල අත්කර ගැනීම සඳහා හිතාමතාම සකස් කරන ලද මාර්ගෝපදේශ පද්ධතියකි. ප්‍රතිපත්තියක් යනු අභිප්‍රාය ප්‍රකාශයක් වන අතර එය ක්‍රියා පටිපාටියක් හෝ ප්‍රොටෝකෝලයක් ලෙස ක්‍රියාත්මක කරනු ලබන්නේ විශේෂයෙන් සංවිධානයක් තුළ පාලන ආයතනයක් විසිනි. විශ්වවිද්‍යාල සහ ආයතන ද ඊට වෙනස් නොවේ. ප්‍රතිපත්ති මනෝමූල සහ විෂයබද්ධ තීරණ ගැනීමේදී සහාය විය හැකිය.

මෙම සංකල්පයෙන් ආරම්භ වූ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය, පහත සඳහන් අරමුණු සහිතව ඉගැන්වීම්, ඉගෙනුම් සහ තක්සේරුකරණ ප්‍රතිපත්තිය (TLAP) සම්පූර්ණයෙන්ම නිර්මාණය කර ක්‍රියාත්මක කර ඇත.

- කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ඉගැන්වීම්, ඉගෙනීම් සහ තක්සේරු ක්‍රියාවලිය සඳහා මාර්ගෝපදේශ නියමාකාර සහ විස්තරාත්මක ආකාරයෙන් සැපයීම.
- දැනුම සහ ඔවුන්ගේ අභිලාෂයන් වැඩි දියුණු කිරීම සඳහා සියලුම සිසුන් සඳහා ප්‍රමිතීන් අඛණ්ඩව ඉහළ නැංවීම.
- විවිධ ඉගැන්වීම්, ඉගෙනුම් සහ තක්සේරු උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමට පීඨය දිරිමත් කිරීම
- ආයතනයේ ඉගැන්වීම එහි සිසුන් කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කරන බව සහතික කිරීම, 'කැපී පෙනෙන' ඉගෙනුම් අත්දැකීම්වල ප්‍රතිශතය නිරන්තරයෙන් වැඩි වන බව සහතික කිරීම
- ගෝලීය මට්ටමින්, උපායමාර්ගිකව සැලසුම් කර ඇති අතර සිසුන්ට අපේක්ෂිත ඉගෙනුම් ප්‍රතිඵල අත්කර ගැනීම සඳහා නිර්මාණය කර ඇති ඉගැන්වීම් සහ ඉගෙනීම සමඟ ඇගයීම් සම්පාත වන බව සහතික කිරීම සහ,
- දේශීය ස්පන්දනය සහිත ගෝලීය නායකයින් සංවර්ධනය කිරීමට දායක වීම.

ප්‍රධාන ප්‍රතිපත්ති මූලධර්මවලින් එකක් ලෙස, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ, අධ්‍යාපනික දැනුම ලබා දීම, දැනුම යෙදීම, කුසලතා සංවර්ධනය සහ දැනුම රඳවා තබා ගැනීම සහතික කරයි. මෙම ප්‍රතිපත්තිය බොහෝ ක්ෂේත්‍ර ආවරණය වන පරිදි සකස් කර ඇත. පිටු දහතුනකින් යුත් ලේඛනයේ සාරාංශය පහත දැක්වේ.

පාඨමාලා දළ සටහන්

විෂයමාලා සංවර්ධන සහ සමාලෝචන ප්‍රතිපත්තිය (CDRP) සමඟ ඒකාබද්ධ වෙමින්, ඉගැන්වීම්, ඉගෙනීම් සහ තක්සේරු සැලැස්ම (TLAP) ආරම්භ වන්නේ පාඨමාලා දළ සටහන (CO) සමඟින් වන අතර එය වැඩසටහන් ඉගෙනුම් අරමුණු (PLOs) විස්තර කරන අතර මෙම අරමුණු එක් එක් පාඨමාලාව සඳහා ඉගෙනුම් ප්‍රතිඵල (LOs) තුළට ඒකාබද්ධ කර ඇති ආකාරය පැහැදිලි කරයි. මෙම ක්‍රියාවලිය පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනයේ (PIM) මෙහෙවර ප්‍රකාශය සමඟ සම්පාත වේ. පාඨමාලා දළ සටහනට බෙදා හැරීමේ ආකාරය, සැසි ගණන මත පදනම් වූ අධ්‍යයන ක්ෂේත්‍ර, ආකෘතික සහ සාරාංශගත තක්සේරු කිරීම් සහ සිසුන් සඳහා අපේක්ෂාවන් වැනි තොරතුරු ඇතුළත් වේ. මෙම අපේක්ෂාවන්ට පැහැදිලි පරාමිතීන්, තක්සේරු ව්‍යුහයක්, මූලික පෙළපොත සහ අවශ්‍ය ඕනෑම අමතර කියවීමක් මෙන්ම පාඨමාලාව සඳහා යෝජිත විභව පර්යේෂණ ක්ෂේත්‍ර මගින් සහාය වේ. එයට පොදු සහ බහුලව අදාළ වන ක්ෂේත්‍ර වන රචනා වෙෘරත්ව ප්‍රතිපත්තිය, තත්වයන් අවම කිරීම සඳහා වූ ක්‍රියා පටිපාටි සහ නිසි අධ්‍යයන හැසිරීම සඳහා අපේක්ෂාවන් ද ඇතුළත් වේ.

ආකෘතික සහ සාරාංශික තක්සේරු කිරීම්

ඉගැන්වීම යනු දැනුම පෝෂණය කිරීම සහ ලබා දීම, කුසලතා සංවර්ධනය සහ නිපුණතා ඇතුළත් නිවැරදි ආකල්පය ඇති කිරීමයි. සාමාන්‍යයෙන්, පැවරුම් කුසලතා සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කර ඇති අතර, විභාගය පශ්චාත් උපාධි මට්ටමින් දැනුම සහ දැනුම ලබා දී ඇති අවස්ථාවට අදාළ කර ගැනීම තක්සේරු කිරීමට සකසා ඇත. ක්ෂේත්‍ර කටයුතු, කර්මාන්ත චාරිකා, විශ්ලේෂණය, ඉදිරිපත් කිරීම් සහ සම්මුඛ සාකච්ඡා යනු විශේෂඥයින් සාමාන්‍යවාදීන් බවට පරිවර්තනය කිරීම සහ සංවිධාන තුළ හරස් ක්‍රියාකාරී දැනුම ලබා ගැනීම සඳහා පැවරුම්වලට ඇතුළත් කර ඇති ක්ෂේත්‍ර කිහිපයකි.

වැදගත් ක්ෂේත්‍ර සැලකිල්ලට ගනිමින් විවිධ තක්සේරු කිරීම් සඳහා මාතෘකා පාඨය (Rubrics) නිර්මාණය කර ඇත. නිදසුනක් වශයෙන්, රචනා ආකාරයේ අවසාන විභාගය සඳහා සකස් කරන ලද මාතෘකා පාඨය, ඇගයීමේ අරමුණ වෙනස් වන බැවින් තනි ලිඛිත පැවරුමකට වෙනස් වේ. ඉදිරිපත් කිරීම් සඳහා මාතෘකා පාඨය, අනෙකුත් මාතෘකා පාඨයන් හා සසඳන විට වෙනස් වේ. කෙසේ වෙතත්, සෑම මාතෘකා පාඨයක්ම දැනුම යෙදීම, සංකල්ප සහ ස්ථාපිත න්‍යායන් අභියෝගයට ලක් කිරීම සහ ඔවුන්ගේ අත්දැකීම් බෙදා ගැනීම කෙරෙහි අවධානය යොමු කරයි. අපේක්ෂිත අධ්‍යයන ප්‍රතිඵල සමඟ, රචනා වෙරළුව ප්‍රතිඵල, පැවරුම් සඳහා ප්‍රමාද වූ ඉදිරිපත් කිරීම්, ප්‍රතිපත්තියේ පැහැදිලිව දක්වා ඇත.

විභාග ප්‍රශ්න පත්‍රය හත්වන සතිය වන විට එක් එක් ප්‍රශ්නය සඳහා ආදර්ශ පිළිතුරු සමඟ ඉදිරිපත් කළ යුතු අතර, එක් එක් කොටස සහ උප කොටස සඳහා විශේෂයෙන් වෙන් කරන ලද ලකුණු ලබා දිය යුතුය. මෙය ප්‍රතිඵල පවත්වා ගැනීම සඳහා පමණක් නොව, දෙවන ලකුණු කිරීමේ ක්‍රියාවලිය පහසු කිරීම සඳහා ද වේ. අවසන් කළ පසු සියලුම ලකුණු සිසුන්ට නිකුත් කිරීමට පෙර විභාග මණ්ඩලය විසින් අනුමත කළ යුතුය. අසමත්වීම් වලට සලකන ආකාරය, නැවත විභාග සඳහා සහ නැවත පැවරුම් සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාවලිය සහ අවසාන ශ්‍රේණිගත කිරීම තීරණය කිරීම සඳහා එවැනි ලකුණු සැලකිල්ලට ගන්නා ආකාරය ද ප්‍රතිපත්තියට ඇතුළත් වේ.

පශ්චාත් උපාධි අධ්‍යයන සඳහා ප්‍රමුඛතම ආයතනය වශයෙන් ඉගැන්වීම්, ඉගෙනුම් සහ තක්සේරු සැලැස්ම (TLAP) ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවට (SLQF) අනුව අවසාන පර්යේෂණ කෙරෙහි අවධානය යොමු කරන අතර, අවසාන පර්යේෂණ සඳහා අධ්‍යයන සම්භාර 15 ක් වෙන් කරන අතර, පසුව පර්යේෂණ පිළිබඳ ප්‍රශ්න ඉදිරිපත් කිරීම සඳහා නිසි වාචික පරීක්ෂණයක් සිදු කරයි. ඉගැන්වීම්, ඉගෙනුම් සහ තක්සේරු සැලැස්ම සමීපව පරීක්ෂා කිරීමෙන් හෙළි වන්නේ බොහෝ ඉගෙනුම් හවුල්කරුවන් ආයතනික අංශයෙන් පැමිණෙන බැවින්, පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනය (PIM) සාම්ප්‍රදායික නිබන්ධනය වෙනුවට පර්යේෂණ ව්‍යාපෘති වර්ග හතක් ඉදිරිපත් කරන බවයි. එබැවින්, ප්‍රතිපත්තිය බහු විකල්ප ලබා දීමෙන් මෙම අවශ්‍යතාවය සපුරාලයි.

අවසාන වශයෙන්, ඉගැන්වීම්, ඉගෙනීම් සහ තක්සේරු සැලැස්ම (TLAP), අධීක්ෂණ ක්‍රියාවලිය සහ ඇගයීම් ක්‍රියාවලිය කෙරෙහි අවධානය යොමු කරන අතර මෙම ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා වගකිව යුත්තේ කවුරුන්ද යන්න පැහැදිලිව හඳුනා ගැනීම සහ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ (PIM) TLAP සාර්ථකව ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම කරනු ලබයි.

වටිනාකම් අභිප්‍රේරකය 2 - ගැඹුරු අවබෝධයක් සහිත සහ අදාළ පර්යේෂණ සහ ප්‍රකාශන

මෙහෙවර ප්‍රකාශයේ දක්වා ඇති පරිදි, බලපෑම් සහිත පර්යේෂණ අනුගමනය කිරීම කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ මූලික අරමුණු වලින් එකකි. කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ විශිෂ්ටත්වයේ ගොඩනැගිල්ලේ ප්‍රධාන කුළුණු වලින් එකක් ලෙස පර්යේෂණය පෙන්නුම් කරයි. කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය උසස් තත්ත්වයේ පර්යේෂණ සිදු කිරීමට කැපවී සිටින අතර සියලුම පීඨ සාමාජිකයින් සහ සිසුන් සැලසුම් කිරීමේ සිට සොයාගැනීම් ප්‍රකාශනය සහ යෙදීම දක්වා පර්යේෂණයේ සියලු අංශවල අඛණ්ඩතාව සහ විනිවිදභාවය පවත්වා ගනිමින් මූලධර්ම සහ යහපත් පිළිවෙත් පිළිපදිනු ඇතැයි අපේක්ෂා කරනු ලබයි.

බුද්ධිමය සොයාගැනීම් පිළිබඳ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ පර්යේෂණ කළඹට පීඨයේ සහ ඉගෙනුම් හවුල්කරුවන්ගේ දායකත්වයන් ඇතුළත් වේ. බුද්ධිමය දායකත්ව කළඹ, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ මෙහෙවර, ප්‍රතිදානයන්, ප්‍රතිඵල සහ උපාය මාර්ගවල ප්‍රකාශිත පරිදි ආයතනයේ පර්යේෂණ ප්‍රමුඛතා පිළිබිඹු කරයි. කළඹෙහි දායකත්වයන්හි සැලකිය යුතු මට්ටමක් අවසාන වසරේ පර්යේෂණ පාදක ව්‍යාපෘති මත පදනම් වූ සම-සමාලෝචනය කරන ලද සඟරා ලිපි, සිද්ධි අධ්‍යයන සහ කර්මාන්ත සමීක්ෂණ ආකාරයෙන් වේ. පර්යේෂණ සම්මන්ත්‍රණ, ආචාර්ය උපාධි සම්මන්ත්‍රණ සහ විදේශීය විශ්වවිද්‍යාල සමඟ කටයුතු කිරීම හරහා දැනුම බෙදා ගැනීමෙන් ව්‍යාපාරයට සහ සමාජයට බුද්ධිමය දායකත්වයන්ගේ බලපෑම තවදුරටත් වැඩිදියුණු වේ.

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ සිදු කරන ලද පර්යේෂණ ව්‍යාපෘති ව්‍යවහාරික පර්යේෂණ සහ සමාජ පර්යේෂණ යන දෙකම කෙරෙහි අවධානය යොමු කරනු ලබයි. ව්‍යවහාරික පර්යේෂණ ව්‍යාපෘති සංවිධානවල ගැටලු විසඳීම අරමුණු කර ගෙන ඇත. සමාජ පර්යේෂණ ව්‍යාපෘති දැනුම නිර්මාණය කිරීම කෙරෙහි අවධානය යොමු කරන අතර මෙම දැනුම ශාස්ත්‍රීය ප්‍රකාශන හරහා බෙදා හරිනු ලැබේ.

පර්යේෂණ ප්‍රායෝගිකව සිදු කිරීම සහ දැනුම බෙදා ගැනීම පර්යේෂණයේ වැදගත් අංගයකි. කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ (PIM) පර්යේෂණ සොයාගැනීම් ප්‍රධාන වශයෙන් ශ්‍රේණිගත කරන ලද සහ සම-සමාලෝචනය කරන ලද සඟරාවල ප්‍රකාශයට පත් කිරීමෙන් නව දැනුම ජනනය කිරීමට යොදා ගනී. කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය සහ ඉගෙනුම් හවුල්කරුවන් විසින් පවත්වනු ලබන පර්යේෂණ බොහෝ විට අන් අය විසින් උපුටා දක්වනු ලබන අතර, එමඟින් නිපදවන දැනුමේ මාරු කිරීමේ හැකියාව සහ වටිනාකම තවදුරටත් තහවුරු වේ.

දැනුම නිර්මාණය සඳහා පීඨයේ දායකත්වය පහත වගුව හරහා දැක්වේ. ඒ අනුව, 2024 දී ප්‍රකාශන සහ උපුටා දැක්වීම් සංඛ්‍යාව පෙර වසරට සාපේක්ෂව ඉහළ ගොස් තිබේ.

සම්පූර්ණ කරක ලද වර්ෂය	ජර්නල පත්‍රිකා	සම්මන්ත්‍රණ කටයුතු	පොත් පරිච්ඡේද	සිද්ධි අධ්‍යයන	උපුටා දැක්වීම්
2024	14	01	-	-	82
2023	15	-	01	-	87
2022	12	06	01	01	42

MBA සිසුන් විකල්ප පහකින් එක් පර්යේෂණ ව්‍යාපෘතියක් තෝරා ගැනීමට අවශ්‍ය වේ. MBA ඉගෙනුම් හවුල්කරුවන් විකල්ප පහකින් එක් පර්යේෂණ ව්‍යාපෘතියක් තෝරා ගත යුතුය, එනම් කළමනාකරණ පර්යේෂණ ව්‍යාපෘතිය (MRP), කළමනාකරණ කුසලතා පර්යේෂණ ව්‍යාපෘතිය

(MSRP), කළමනාකරණ සිද්ධි අධ්‍යයන පර්යේෂණ ව්‍යාපෘතිය (MCRP), ව්‍යවසායකත්ව කුසලතා පර්යේෂණ ව්‍යාපෘතිය (ESRP) සහ කළමනාකරණ ක්ෂේත්‍ර පර්යේෂණ ව්‍යාපෘතිය (MFRP). මේවායින්, කළමනාකරණ පර්යේෂණ ව්‍යාපෘතිය (MRP), කළමනාකරණ සිද්ධි අධ්‍යයන පර්යේෂණ ව්‍යාපෘතිය (MCRP), සමාජ පර්යේෂණ කෙරෙහි අවධානය යොමු කරන අතර අනෙක් ඒවා ව්‍යවහාරික පර්යේෂණ කෙරෙහි අවධානය යොමු කරයි. මෙම පර්යේෂණය සඳහා ප්‍රමුඛතා පදනම් වී ඇත්තේ ඉගෙනුම් හවුල්කරුවන් අතර ඇති ඉල්ලුම අනුව තීරණය වන කර්මාන්තයට ඒවායේ බලපෑම මත ය. සිසුන්ගෙන් බහුතරයක් කර්මාන්තයේ ගැටළු සෘජුවම විසඳන කළමනාකරණ ක්ෂේත්‍ර පර්යේෂණ ව්‍යාපෘති (MFRP) තෝරා ගනී.

ඒ අනුව, MBA වැඩසටහනේ පසුගිය වසර හතර සඳහා පර්යේෂණ ව්‍යාපෘති පහත පරිදි වේ.

සම්පූර්ණ කරන ලද වර්ෂය	MFRP	MCRP	MSRP	ESRP	MRP	සම්පූර්ණ කරන ලද MBA පර්යේෂණ ව්‍යාපෘති
2024	295	1	6	15	13	330
2023	254	3	8	14	11	290
2022	222	1	3	28	16	270
2021	247	3	6	8	14	278

ඉහත වගුවේ දක්වා ඇති පරිදි, ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඉගෙනුම් හවුල්කරුවන්ගේ සම්පූර්ණ කරන ලද පර්යේෂණ ව්‍යාපෘති වාර්ෂිකව වැඩි වෙමින් පවතින අතර, 2024 වර්ෂයේදී සම්පූර්ණ කරන ලද පර්යේෂණ ව්‍යාපෘතිවලින් 13% කට වඩා වැඩි වීමක් දක්නට ලැබේ. ඉහත පර්යේෂණ ව්‍යාපෘති තවදුරටත් සම්මන්ත්‍රණ පත්‍රිකා සහ සඟරා ලිපි බවට පත් කර ඇති අතර, එමඟින් කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය මගින් බිහි කරන ලද පර්යේෂණවල ගුණාත්මකභාවය තවදුරටත් ඉස්මතු කෙරේ. ශිෂ්‍ය පර්යේෂණ කාර්යයන් සඳහා, රචනා චෞරත්වය පරීක්ෂා කිරීම පිණිස වාර්ෂිකව රුපියල් මිලියන 4.4ක වියදමක් දරමින් PIM ආයතනය මගින් Turnitin මෘදුකාංගය මිල දී ගනු ලබයි.

නිව් සවුත් වේල්ස් විශ්ව විද්‍යාලය (UNSW), පර්යේෂණ කුසලතා වර්ධනය කිරීම සඳහා සහයෝගය ලබා දී ඇති අතර, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ (PIM) ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි හිමි (MBA) පර්යේෂණ කටයුතුවල කැපී පෙනෙන කාර්ය සාධනයක් පෙන්නුම් කරන උපාධිධාරීන්ට ආචාර්ය උපාධි ස්ථාන ලබා දී ඇත. මේ වන විට, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ උපාධිධාරීන් හත් දෙනෙකු කැන්බරා හි නිව් සවුත් වේල්ස් විශ්වවිද්‍යාලයේ (UNSW) ආචාර්ය උපාධි පර්යේෂණ අධ්‍යයන කටයුතු සිදු කිරීම සඳහා ශිෂ්‍යත්ව ලබාගෙන ඇත. සෑම ශිෂ්‍යත්වයක්ම වසර තුනක අධ්‍යයන කාලයක් ආවරණය කරයි.

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ (PIM) පර්යේෂණ මධ්‍යස්ථානය පර්යේෂණ ව්‍යාපෘති, සිද්ධි අධ්‍යයන, කර්මාන්ත සමීක්ෂණ සහ සඟරා ලිපි සහ සම්මන්ත්‍රණ පත්‍රිකා හරහා ඒවායේ ප්‍රතිඵල බෙදා ගැනීම අධීක්ෂණය කරයි. පර්යේෂණවලින් වර්ධනය කරන ලද සොයාගැනීම් සහ සිද්ධි අධ්‍යයන ඉගැන්වීමේදී ද භාවිතා වේ. කාර්ය මණ්ඩල සාමාජිකයින්ට ගෞරව සම්මාන මගින් පර්යේෂණ සඳහා ඔවුන්ගේ දායකත්වය සඳහා පිළිගැනීමක් සහ ත්‍යාග පිරිනමනු ලැබේ.

PIM ආයතනය තම මව් විශ්වවිද්‍යාලය වන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පර්යේෂණ ප්‍රදාන උළෙලේදී සහයෝගී හවුල්කරුවෙකු ලෙස කටයුතු කරන ලද අතර, ශ්‍රී ලංකා රුපියල් මිලියන 2.4 ක මුදලක් පරිත්‍යාග කරන ලදී. මෙම හවුල්කාරිත්වය මගින් අධ්‍යයන විශිෂ්ටත්වය පෝෂණය කිරීමට සහ මව් විශ්වවිද්‍යාලය සමඟ එහි කල් පවතින සම්බන්ධතාවය ශක්තිමත් කිරීමට PIM ආයතනය දක්වන දැඩි කැපවීම අවධාරණය කෙරේ.

ආචාර්ය උපාධි වැඩසටහන්

එහි ස්ථාපිත කළ දා සිට, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය (PIM) තමන්ගේම ආචාර්ය උපාධි පාඨමාලාවක් පවත්වාගෙන යන අතර, එය ක්‍රියාත්මක කිරීමේදී ඉතා ඉහළ ප්‍රමිතීන් පවත්වා ගෙන යයි. විශ්වවිද්‍යාලයේ ආදර්ශ පාඨය වන "නැගී එන සියල්ල අතර, දැනුම ශ්‍රේෂ්ඨතම වේ" යන්නෙන් පිළිබිඹු වන පරිදි, ආචාර්ය උපාධි අපේක්ෂකයින් ඉහළ අදාළත්වයක් සහ ප්‍රමුඛතාවයක් ඇති ක්ෂේත්‍රවල නව දැනුම නිර්මාණය කිරීම කෙරෙහි දැඩි උනන්දුවක් දැක්විය යුතු බව කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය විශ්වාස කරයි. ඊට අමතරව, ආයතනික පසුබිමක පර්යේෂණ භාවිතයෙන් අපේක්ෂකයින්ට ව්‍යාපාර සහ කර්මාන්තවල තීරණාත්මක ගැටලු විසඳීමට උපකාර කිරීම අරමුණු කරගත් ව්‍යාපාර පරිපාලන ආචාර්ය (DBA) වැඩසටහනක් කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය විසින් පිරිනමයි.

සම්පූර්ණ කරන ලද වර්ෂය	සම්පූර්ණ කරන ලද ආචාර්ය උපාධි සංඛ්‍යාව
2024	03
2023	04
2022	01
2021	01

PIM වාර්ෂික පර්යේෂණ සමුළුව (PIMARC)

ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි (MBA) ඉගෙනුම් හවුල්කරුවන් සියල්ලන්ම ඔවුන්ගේ අවසන් වසරේදී පර්යේෂණ සිදු කරන අතර, තෝරාගත් සුවිශේෂී ඉගෙනුම් හවුල්කරුවන් මෙම අවස්ථාව හරහා පර්යේෂණ ප්‍රජාව සමඟ ඔවුන්ගේ පර්යේෂණ ව්‍යාපෘතිවලින් ලබාගත් නව දැනුම බෙදා ගනී. ඉගෙනුම් හවුල්කරුවන්ගේ පර්යේෂණ ප්‍රදර්ශනය කිරීම සඳහා නිර්මාණය කරන ලද ශිෂ්‍ය පර්යේෂණ දිනය 2016 දී හඳුන්වා දෙන ලදී. 2017 දී වාර්ෂික ආචාර්ය උපාධි සම්මන්ත්‍රණය ආරම්භ කරන ලදී. 2019 දී, මෙම අංගයන් දෙක ඒකාබද්ධ කරමින් කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික පර්යේෂණ සමුළුව (PIMARC) ලෙස හඳුන්වා දෙන ලදී. 2021 දී, කර්මාන්ත සංවාදය ද PIMARC වෙත හඳුන්වා දෙන ලදී.

"කැළඹිලි සහිත කාලවලදී සවිමත්ව සිටීම (*Thriving in Turbulent Times*) යන කාලෝචිත තේමාව යටතේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ (USJ) කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ (PIM) වාර්ෂික පර්යේෂණ සමුළුව (PIMARC 2025) පැවැත්වීමට නියමිතය. PIMARC 2025, අපගේ මව් විශ්වවිද්‍යාලයේ වාර්ෂික පර්යේෂණ සමුළුව වන 2025 ව්‍යාපාර කළමනාකරණ ජාත්‍යන්තර සමුළුවට (ICBM) බෙහෙවින් සම්බන්ධ වන පරිදි සැලසුම් කර ඇති අතර, එහි තේමාව වූයේ "තාක්ෂණික නායකයින් සහ පරිවර්තනය: තිරසාර ව්‍යාපාර පරිවර්තනය සඳහා පරිවර්තනීය තාක්ෂණයන් උපයෝගී කර ගැනීම (*Tech Titans and turmoil: Leveraging disruptive technologies for sustainable business transformation)*" වන අතර එය කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය අතර පොහොසත් පර්යේෂණ සහක්‍රියාවක් **ඇති කිරීමේ අරමුණ** සපුරාලයි. "මෙහෙවර අනුව කටයුතු කිරීමට නැඹුරු" සංවිධානයක් වශයෙන් කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය (PIM), PIMARC 2025 සංවිධානය කර ඇත්තේ "ගැඹුරු අවබෝධයක් සහිත සහ අදාළ පර්යේෂණ" යන දෙවන ස්ථම්භය පෙළගැස්වීමට සහ ශක්තිමත් කිරීමට පමණක් නොව, "නව ලෝකය සඳහා ව්‍යාපාරික පාසල" යන දැක්ම යථාවත් කර ගැනීමට ද වේ.

PIMARC හි ඉදිරිපත් කරන ලද පර්යේෂණ ප්‍රකාශන ගණන අඛණ්ඩව වැඩි වී ඇති අතර, එය පහත වගුවේ දක්වා ඇති පරිදි ශුද්ධ හා ව්‍යවහාරික පර්යේෂණ යන දෙකෙහිම පුළුල් පරාසයක් නියෝජනය කරයි.

වර්ෂය	පර්යේෂණ ඉදිරිපත් කිරීම්						
කලමනාකරණ පශ්චාත් උපාධි ආයතනය ආයතනය කැන්බරා හි නිව් සවුත් වේල්ස් විශ්වවිද්‍යාලයේ (UNSW) ව්‍යාපාර පාසල (SBU) සමඟ පර්යේෂණ සහයෝගීතාවයක් ඇති කර ගෙන තිබේ. ව්‍යාපාර, ආර්ථික විද්‍යාව, කළමනාකරණය සහ රාජ්‍ය ප්‍රතිපත්ති යන ක්ෂේත්‍රවල පර්යේෂණ ක්‍රියාකාරකම් සඳහා මෙම ආයතන දෙක සහයෝගයෙන් කටයුතු කරයි. ලොව පුරා ව්‍යාපාරික වැඩසටහන් වලින් 5% ක් පමණක් Association to Advance Collegiate Schools of Business (AACSB) විසින් ප්‍රතිතනය කර ඇති අතර, SBU යනු ඕස්ට්‍රේලියානු අගනුවර කලාපයේ AACSB-ප්‍රතිතනය ලත් එකම ව්‍යාපාරික පාසලයි. SBU ආයතනය පාලනය සහ රාජ්‍ය අංශයේ ගිණුම්කරණය, ආර්ථිකමිතික විද්‍යාව සහ ආර්ථික විශ්ලේෂණය, මානව සම්පත් කළමනාකරණය, ව්‍යවසායකත්වය සහ නවෝත්පාදනය, සැපයුම් සහ විශාල දත්ත විශ්ලේෂණ, නායකත්වය සහ වෙනස්වීම් කළමනාකරණය, රාජ්‍ය අංශයේ කළමනාකරණය සහ අලෙවිකරණය යන ක්ෂේත්‍රවල ක්‍රියාකාරී පර්යේෂණ වැඩසටහන් පවත්වයි.
UNSW යනු Group of Eight හි ආරම්භක සාමාජිකයෙකු වන අතර ඕස්ට්‍රේලියාවේ පර්යේෂණ ප්‍රමුඛ - විශ්ව විද්‍යාල වලින් මුල් තැන ගත් එකකි. 2020 QS ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම්වල එය 43 වන ස්ථානයට පත්විය. . UNSW ආයතනය, '2012 Excellence in Research for Australia Report'තුළ පිළිගැනීමට ලක් වූ අතර, එමඟින් විශ්වවිද්‍යාලයේ සියලුම පුළුල් පර්යේෂණ ක්ෂේත්‍රවල කාර්යසාධනය "ලෝක ප්‍රමිතියට අනුව, ඉහළින් හෝ ඉතා ඉහළින්" පවතින බවට තක්සේරු කරන ලදී. UNSW පර්යේෂණ ශක්තීන් පුළුල් හා විවිධ විෂය ක්ෂේත්‍රයන් හරහා විහිදේ. UNSW සහ කලමනාකරණ පශ්චාත් උපාධි ආයතනය අන්‍යෝන්‍ය උනන්දුව, පීඨ හුවමාරුව සහ විෂය ක්ෂේත්‍රයන්හි ඒකාබද්ධ අධ්‍යයන පර්යේෂණ ව්‍යාපෘති භාර ගනී. UNSW පර්යේෂණ ශක්තීන් පුළුල් හා විවිධාකාර විෂය ක්ෂේත්‍රයන් පුරා විහිදේ. UNSW සහ PIM, අන්‍යෝන්‍ය උනන්දුවක් දක්වන ක්ෂේත්‍ර, පීඨ හුවමාරුව සහ PIM හි ආචාර්ය උපාධි වැඩසටහන ප්‍රවර්ධනය කිරීම යන ක්ෂේත්‍රවල ඒකාබද්ධ අධ්‍යයන පර්යේෂණ ව්‍යාපෘති සිදු කරයි.

කලමනාකරණ පශ්චාත් උපාධි ආයතනය ආයතනය පර්යේෂණ සිසුන්ට UNSW විශ්වවිද්‍යාලයේ ආචාර්ය උපාධි ස්ථානගත කිරීම් ලබා ගැනීමට පහසුකම් සපයයි. UNSW පීඨයේ සාමාජිකයින් කිහිප දෙනෙකු ආචාර්ය උපාධි පරීක්ෂකවරුන් ලෙස සහ කලමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ප්‍රමුඛතම පර්යේෂණ සඟරාව වන ශ්‍රී ලංකා කළමනාකරණ සඟරාවේ (SLJM) කතුවැකි උපදේශක මණ්ඩලයේ සේවය කරති. මෙය තවත් අද්විතීය අගය එකතු කිරීමක් වන අතර, කලමනාකරණ පශ්චාත් උපාධි ආයතනය තම ඉගෙනුම් හවුල්කරුවන්ට ලබා දෙන අවස්ථාවකි. එබැවින්, මෙම අද්විතීය අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්නා ලෙස කලමනාකරණ පශ්චාත් උපාධි ආයතනය ඉගෙනුම් හවුල්කරුවන්ගෙන් දැඩි ලෙස ඉල්ලා සිටී.

තනි පුද්ගල උපදේශනය

තනි පුද්ගල උපදේශන සැසි හරහා, ඉගෙනුම් හවුල්කරුවන්ට අධ්‍යයන අභියෝගවලට මුහුණ දීමට, ඉලක්ක සපුරා ගැනීමට සහ ඔවුන්ගේ විභවය උපරිම කර ගැනීමට පුද්ගලාරෝපිත මග පෙන්වීම සහ සහාය ලැබේ. අපගේ පුහුණු වැඩසටහන් මඟින් ඉගෙනුම් හවුල්කරුවන්ට කාල කළමනාකරණය, අධ්‍යයන ශිල්පීය ක්‍රම සහ ආතති කළමනාකරණය වැනි අත්‍යවශ්‍ය කුසලතා වර්ධනය කිරීමට බලය ලබා දෙන අතර, ඔවුන් තම අධ්‍යයන කටයුතුවල සහ ඉන් ඔබ්බට සාර්ථක වීමට හොඳින් සූදානම් ව සිටින බව සහතික කරයි. ඊට අමතරව, කලමනාකරණ පශ්චාත් උපාධි ආයතනය, ඉගෙනුම් හවුල්කරුවන්ට ඔවුන්ගේ පශ්චාත් උපාධි අධ්‍යයන සහ වෘත්තීය වර්ධනය පුරාවට සහාය වීම සඳහා අධ්‍යයන උපදේශන, වෘත්තීය උපදේශන සහ සුවතා සම්පත් ඇතුළු පුළුල් පරාසයක සහාය සේවා සපයයි.

PIM ව්‍යාපාර ඉන්කියුබේටරය “Genesis”

කලමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ‘ජනතාව සහ සංවිධාන තුළ වටිනාකමක් නිර්මාණය කිරීමේ’ මෙහෙවරට අනුකූලව, එහි ව්‍යාපාර ඉන්කියුබේටර් "Genesis" අත්‍යවශ්‍ය සහ වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. මෙහිදී අධ්‍යයන හා කර්මාන්ත කුසලතා ඇති විශේෂඥයින් කණ්ඩායමක් සමඟින්, සමාජයේ හඳුනාගත් අංශ අතර ව්‍යවසායකත්වයේ වර්ධක ව්‍යාප්තිය අපේක්ෂා කරනු ලබයි. අවසාන ව්‍යාපෘතිය ලෙස ව්‍යවසායකත්ව කුසලතා පර්යේෂණ ව්‍යාපෘති තෝරා ගන්නා ව්‍යාපාර පරිපාලනපති පශ්චාත් උපාධි අපේක්ෂක සිසු සිසුවියන්ට මඟ පෙන්වීම මූලික අරමුණ වුවද, වර්තමානයේ Genesis ආයතනය, කලමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ භෞතික සීමාවන් ඉක්මවා, රටේ අලුතන් ව්‍යාපාර අරඹන ව්‍යවසායකයින්ගේ හැකියාවන් ඉහළ නැංවීම සඳහා උත්ප්‍රේරකයක් ලෙස එහි සේවාවන් ව්‍යාප්ත කර ඇත.

ව්‍යවසායකත්ව සංවර්ධනයේ මෙම අභිප්‍රාය පෙරදැරි කරගෙන, අපගේ ඉගෙනුම් හවුල්කරුවන් ඉදිරියට ගෙන යන ව්‍යාපාරික අදහස් ව්‍යාපෘති යෝජනා ලෙස පරීක්ෂා කිරීම, යෝජනා වෙනස් කිරීමට සහාය වීම, අදහස් ශක්‍ය ව්‍යාපාර බවට පරිවර්තනය කිරීම සඳහා පුහුණු කිරීම, දුර්වල ආරම්භකයින් පෝෂණය කිරීම, ආරම්භක බාධක ජය ගැනීමට සහ ව්‍යවසායක ගමන දිගේ ස්ථාවරව ගමන් කිරීමට ඔවුන්ට මග පෙන්වීම ඇතුළු බොහෝ ක්‍රියාකාරකම් Genesis පෙළගස්වයි. අපගේ ඉගෙනුම් හවුල්කරුවන් ඔවුන්ගේ පශ්චාත් උපාධි අධ්‍යයනයන්හි දී ව්‍යාපාර කළමනාකරණය පිළිඳ ඵලදායී ලෙස ලබා ගන්නා කුසලතා සහ දැනුම යොදා ගනිමින් අපේක්ෂිත ප්‍රතිඵල අත්කර ගන්නා බවට Genesis සහතික වේ.

කලමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ අපගේ ඉගෙනුම් හවුල්කරුවන්ට වඩා ඔබ්බට යමින්, නවක ව්‍යවසායකයින් ඔවුන් ක්‍රියාත්මක වන ව්‍යාපාරික පරිසරයේ සංකීර්ණතා සැරිසැරීමට අත්‍යවශ්‍ය කුසලතා සහ මානසිකත්වයෙන් සන්නද්ධ කිරීම සඳහා පෙළඹවීම Genesis හි අරමුණයි. මෙම අභ්‍යාසයේදී, Genesis, කලමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ශක්තිමත් ආදි සිසුන් හරහා තෝරාගත් ආරම්භක ව්‍යාපාර සැපයුම්කරුවන්, ගැනුම්කරුවන්, වෙනත් අධ්‍යාපන ආයතන, වෙළඳ සංගම්, නියාමකයින් සහ සේවා සපයන්නන්ගේ ජාල සමඟ සම්බන්ධ කරන ගතික මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කරයි. එවැනි කටයුතු සමඟ එක්ව, උපදේශන සැසි, තනි උපදේශන, පුහුණු වැඩසටහන් සහ නඩු ඉදිරිපත් කිරීම් ඇතුළත් වන අතර එමඟින් අවසානයේ ජාතියේ ආර්ථික දියුණුවට දායක වනු ඇත.

මහාචාර්ය උදිත ලියනගේ අනුස්මරණ පුස්තකාලය

කලමනාකරණ පශ්චාත් උපාධි ආයතන පුස්තකාලය ශ්‍රී ලංකාවේ වඩාත්ම පුළුල් කළමනාකරණ ක්ෂේත්‍රයේ පොත්පත් සහිත පුස්තකාලවලින් එකක් වන අතර එය වෙළුම් 18,000 කට අධික සංඛ්‍යාවකට ප්‍රවේශය සපයයි. ආයතනයේ ඉගෙනුම් හවුල්කරුවන්, වෘත්තිකයන් සහ පීඨය සඳහා මූලික තොරතුරු මූලාශ්‍රය ලෙස ක්‍රියා කරන එය මගින් නිරන්තරයෙන් වැඩිදියුණු වන සේවාවක් සැපයීමේ අරමුණින්, නිරන්තරයෙන්ම පුස්තකාලයේ දැනුම් මූල පද්ධතිය මෙන්ම ප්‍රවේශය සහ පහසුකම් පොහොසත් කර පුළුල් කරනු ලැබේ. කලමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ පුස්තකාලය කලමනාකරණ පශ්චාත් උපාධි ආයතනය ගොඩනැගිල්ලේ පළමු මහලේ පිහිටා ඇත. තනි අධ්‍යයන පාඨන කුටි වල සිටWi-Fi පහසුකම සහිත විවෘත අධ්‍යයන මේස දක්වා ඉගෙනුම් හවුල්කරුවන් 60 දෙනෙකු සඳහා පුස්තකාලයේ ආසන පහසුකම් ඇත. *Ebscohost* සහ *Emerald* යන දත්ත පද්ධති දෙක සම්පූර්ණ පෙළ ලිපි සඳහා සබැඳි ප්‍රවේශය සපයන අතර පුස්තකාලය *Pearson* ප්‍රකාශන, *SAGE* ප්‍රකාශන, ටේලර් සහ ෆ්‍රැන්සිස් ප්‍රකාශන සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මාර්ගගත පොදු ප්‍රවේශ නාමාවලිය ඇතුළු විද්‍යුත් පොත් එකතුවකට ප්‍රවේශය ද සපයනු ලබයි.

කලමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය

අධ්‍යයන පාඨමාලා සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා තොරතුරු තාක්ෂණය නිසි ලෙස භාවිතා කිරීම කෙරෙහි කලමනාකරණ පශ්චාත් උපාධි ආයතනය ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දී ඇත. කලමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ඵලදායී, කාර්යක්ෂම සහ නවීන ඉගෙනුම් ද්වාරය වන ප්‍රඥා, ඉහළම ගෝලීය විශ්වවිද්‍යාලවල ඉගෙනුම් කළමනාකරණ පද්ධති සමග සංසන්දනය කළ හැකිය. මෙම අවශ්‍යතාවය සපුරාලීමේදී, කලමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය , ඉගෙනුම් හවුල්කරුවන්, පීඨය සහ පරිපාලනය යන පාර්ශ්ව තුන සමඟ සමීපව සම්බන්ධ වෙමින් තොරතුරු තාක්ෂණයට අදාල ඔවුන්ගේ සියලු උත්සාහයන් සඳහා මඟ පෙන්වීමෙන් සහය ලබාදෙයි.

සූක්ෂම ලෙස සකස් කරන ලද අති නවීන ඉගෙනුම් කළමනාකරණ පද්ධතියක් (ප්‍රඥා) යනු අධ්‍යාපනය සමඟ තාක්ෂණය බාධාවකින් තොරව ඒකාබද්ධ කරන වේදිකාවකි. සිසුන්ගේ අධ්‍යයන ගමන වැඩිදියුණු කිරීම සඳහා විවිධ ක්‍රියාකාරීත්වයන් බාධාවකින් තොරව ඒකාබද්ධ කරන ප්‍රඥා අද්විතීය ශිෂ්‍ය අත්දැකීමක කේන්ද්‍රස්ථානය ලෙස කටයුතු කරනු ලබයි.

මාර්ගගත ඉගෙනුම් උපකාරක : ඩිජිටල් සම්පත් සමුදායක් වෙත ප්‍රවේශ වන්න. දේශන ස්ලයිඩ සහ විද්‍යුත් ග්‍රන්ථවල සිට බහුමාධ්‍ය ඉදිරිපත් කිරීම් දක්වා, අපගේ LMS මඟින් ඉගෙනුම් ද්‍රව්‍ය ඕනෑම වේලාවක, ඕනෑම තැනකට ප්‍රවේශ විය හැකි බව සහතික කරයි.

මාර්ගගත ප්‍රශ්නාවලිය සහ විභාග: කාර්යසාධනය පහසුවෙන් තක්සේරු කිරීම. ‘‘ප්‍රඥා’’ අන්තර්ක්‍රියාකාරී ප්‍රශ්නාවලිය සහ කාලානුරූපී විභාග පවත්වයි, ක්ෂණික ප්‍රතිපෝෂණ ලබා දෙමින් ප්‍රගතිය නිරීක්ෂණය කිරීමට හැකියාව ලබා දෙයි.

සංසද සාකච්ඡා: ප්‍රඥා ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය, ප්‍රශ්න ඉදිරිපත් කිරීම, තීක්ෂ්ණ බුද්ධිය බෙදා ගැනීම සහ සම කණ්ඩායම් සහ උපදේශකයින් සමඟ සහයෝගීතාවය පහසු කරමින් සාකච්ඡා සංසද හරහා සජීවී මාර්ගගත කණ්ඩායම් පෝෂණය කරයි. අතථ්‍ය පන්ති කාමරය අදහස්, මත සහ දැනුම හුවමාරුවෙන් පිරී ඇත.

පුස්තකාල දර්ශකය, ප්‍රගති වාර්තා, පැමිණීම සහ තවත් දේ: මූලික ක්‍රියාකාරීත්වයන්ගෙන් ඔබ්බට, ප්‍රඥා ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය සියල්ල ඒකාබද්ධ අතුරු මුහුණතක් තුළ අධ්‍යයන ප්‍රගති වාර්තා, තත්‍ය කාලීන පන්ති පැමිණීමේ වාර්තා ද සපයන අතර, ආපනශාලා ආහාර පවා වෙන්කරවා ගැනීමට ඔබට ඉඩ සලසයි.

ප්‍රඥා ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය මගින් සිසු සිසුවියන්ට පහසුව, විනිවිදභාවය, පුද්ගලායනය සපයනු ලබයි.

කලමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය කළමනාකරණයේ තො.තා. යෙදුම් ඉගෙනීම, ප්‍රායෝගික සැසි පැවැත්වීම, අන්තර්ජාල සැරිසැරීම, ආයතනයේ ස්ථානීය ප්‍රදේශ ජාල (LAN) පද්ධතිය පාලනය කිරීම සහ අභ්‍යන්තර තො.තා. ආශ්‍රිත අවශ්‍යතා සඳහා පහසුකම් සපයයි. මෙම මධ්‍යස්ථානය නවතම ප්‍රමුඛ මෘදුකාංග යෙදුම් වලින් පිරුණු අති නවීන බහුමාධ්‍ය පරිගණක 80කින්, අධිවේගී අන්තර්ජාල පහසුකම් සහිත ස්ථානීය ප්‍රදේශ ජාලයකින්, අධිවේගී රැහැන් රහිත ජාලයකින් (Wi-Fi), ඉහළ මට්ටමේ බහුමාධ්‍ය ප්‍රක්ෂේපකයක් සහ DTS 6.1 නාලිකා ශබ්ද පද්ධතියකින් සමන්විත වේ.

තත්ත්ව සහතිකකරණය සහ ප්‍රතීතනය

වත්මන් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතිය තත්ත්ව සහතික කිරීම කෙරෙහි ඉතා ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දී ඇත. සියලුම විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල ඉහළ මට්ටමේ ක්‍රියාකාරීත්වයකින් යුත් අභ්‍යන්තර තත්ත්ව සහතික පද්ධති ස්ථාපිත කිරීම අනිවාර්ය වේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිර්දේශ කර ඇති පරිදි අභ්‍යන්තර තත්ත්ව සහතිකකරණ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, පහසුකම් සැලසීම සහ අධීක්ෂණය කිරීම සඳහා PIM තත්ත්ව සහතික ක්‍රියාවලිය සකසා ඇත. එසේම කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය විසින් පිරිනමනු ලබන අධ්‍යයන වැඩසටහන් සඳහා ඇති පිළිගැනීම වැඩි දියුණු කිරීම සහ ප්‍රතීතනය ලබා ගැනීම සඳහා කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය දේශීය හා ජාත්‍යන්තර ප්‍රතීතන ආයතන සමඟ ද කටයුතු කරයි.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සහතික සහ ප්‍රතීතන කවුන්සිලය (QAAC) සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තත්ත්ව සහතික මධ්‍යස්ථානය (CQA), (පෙර, අභ්‍යන්තර තත්ත්ව සහතික කිරීමේ ඒකකය(IQAU)) මෙන්ම ජාත්‍යන්තර ප්‍රතීතන ආයතන සම්බන්ධීකරණය සිදු කරන කලමනාකරණ පශ්චාත් උපාධි ආයතනය, බාහිර තත්ත්ව සහතික සමාලෝචන සඳහා ස්වයං ඇගයීම් වාර්තා සකස් කරන අතරම, සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින්ට තත්ත්ව සහතිකය පිළිබඳ මග පෙන්වීමක් ලබා දෙයි. එසේම කාර්ය මණ්ඩල සාමාජිකයින් අතර යහපත් භාවිතයන් හුවමාරුවට ද පහසුකම් සපයයි.

සමකාලීන ඉගෙනුම් පරිසරය

කලමනාකරණ පශ්චාත් උපාධි ආයතනය යනු ඉගෙනුම් හවුල්කරුවන්ට ඔවුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා සහාය වීම සඳහා අති නවීන ඉගෙනුම් මධ්‍යස්ථාන, ඩිජිටල් සහායක මෙවලම් සහ පර්යේෂණ පහසුකම් ඇතුළු සම්පත් සහ පහසුකම් රාශියක් පිරිනමන නවීන ආයතනයකි. එය මාර්ගගත සම්පත් වෙත ප්‍රවේශ වීමක් වුවත්, අධ්‍යයන කණ්ඩායම්වලට සහභාගී වීමක් වුවත් හෝ

පළපුරුදු උපදේශකයින්ගෙන් මග පෙන්වීමක් ලබා ගැනීමක් වුවත් අපගේ ඉගෙනුම් හවුල්කරුවන්ට අධ්‍යාපනික වශයෙන් විශිෂ්ට වීමට සහ ඔවුන්ගේ ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය මෙවලම් සහ සහාය ලබා ගත හැකිය.

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ආදි විද්‍යාර්ථීන්

ව්‍යාපාර, කර්මාන්ත සහ පුළුල් සමාජයේ සෑම ක්ෂේත්‍රයකම ක්‍රියාකාරීව දායක වෙමින් සිටින අපගේ ආදි විද්‍යාර්ථීන්ගේ ජයග්‍රහණ අපගේ ව්‍යාපාර පරිපාලනපති පශ්චාත් උපාධි පාඨමාලාවේ ප්‍රබල බලපෑමට සාක්ෂි දරයි. ඔවුන්ගේ එම ජයග්‍රහණයන් අනාගත ඉගෙනුම් හවුල්කරුවන් සඳහා මාවත ආලෝකවත් කරයි. සෑම ආදි ශිෂ්‍යයෙක්ම අපගේ වැඩසටහනේ පරිවර්තනීය විභවය මූර්තිමත් කරන අතර, විවිධ කර්මාන්ත හරහා ඔවුන් ලද දැනුම බලපෑම්කාරී දායකත්වයක් බවට පරිවර්තනය කරයි. ඔවුන්ගේ සාර්ථකත්වයන් අපගේ ව්‍යාපාර පරිපාලනපති පශ්චාත් උපාධි පාඨමාලාවේ ගතික ස්වභාවය සහ එය ලබා දෙන අසමසම අවස්ථාවන් අවධාරණය කරයි. නව්‍ය ව්‍යවසායකයින්ගේ සිට බලගතු ආයතනික නායකයින් දක්වා, අපගේ ආදි ශිෂ්‍ය ජාලය ගතික වෘත්තිකයන් හැඩගැස්වීමට අපගේ අධ්‍යාපනයේ බලය පිළිබඳ සාක්ෂියක් ලෙස පවතී.

කලමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ උපාධිධාරීන් කලමනාකරණ පශ්චාත් උපාධි ආයතනයයේ ආදි විද්‍යාර්ථීන්ගේ සංගමයට සම්බන්ධ වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කලමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ සියලුම උපාධිධාරීන්ට හමුවීමට, ඉගෙනීමට, සමාජගත වීමට සහ ජාලගත වීමට අවස්ථා සපයන මෙම සංගමය කලමනාකරණ පශ්චාත් උපාධි ආයතනය එහි සාමාජිකයින්ට අඛණ්ඩ අධ්‍යාපනය සඳහා අවස්ථා ලබා දීම සඳහා ක්‍රියාකාරී වන අතර, එය කලමනාකරණ පශ්චාත් උපාධි උපාධිධාරීන්ට ඔවුන්ගේ වෘත්තීන් දියුණු කර ගැනීමට අවස්ථාව සලසන සංසදයකි.

පර්යේෂණ

පර්යේෂණ මධ්‍යස්ථානය

සහයෝගී පර්යේෂණ හරහා ශාස්ත්‍රීය ක්‍රියාකාරකම් ඉදිරියට ගෙන යාම සඳහා කලමනාකරණ පශ්චාත් උපාධි ආයතනය පර්යේෂණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කර ඇත. කලමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ඉහළම අධ්‍යයන ප්‍රමිතීන් සඳහා ඇති කැපවීම පෙන්නුම් කරමින්, විවිධ ක්ෂේත්‍ර ආවරණය වන ක්‍රියාකාරකම් පර්යේෂණ මධ්‍යස්ථානය මගින් අධීක්ෂණය කරනු ලබයි. පර්යේෂණ මධ්‍යස්ථානය ආචාර්ය උපාධි පාඨමාලා පරිපාලනය කරන අතර පර්යේෂණ ව්‍යාපෘති, සිද්ධි අධ්‍යයන සහ කර්මාන්ත සමීක්ෂණ පැවැත්වීම සහ ඒවායේ සොයාගැනීම් සහරා ලිපි සහ සම්මන්ත්‍රණ පත්‍රිකා ලෙස බෙදා හැරීමට ද සහාය වේ. එය අන්තර් සංස්කෘතික කළමනාකරණය සහ පරිපාලනය කෙරෙහි අවධානය යොමු කරමින් කළමනාකරණ ක්ෂේත්‍රයේ පුළුල් ක්ෂේත්‍රයක අන්තර් විෂය අධ්‍යයන සහ පර්යේෂණ සංවිධානය කිරීම, මෙහෙයවීම සහ ප්‍රවර්ධනය කරයි. පර්යේෂණ මධ්‍යස්ථානය පර්යේෂණ සොයාගැනීම් සාකච්ඡා කිරීම සඳහා සම්මන්ත්‍රණ සහ වැඩමුළු ද සංවිධානය කරයි. මෙම උත්සාහයන් තුළින්, පර්යේෂණ මධ්‍යස්ථානය දැනුම ප්‍රායෝගිකව ප්‍රායෝගිකව පරිවර්තනය කිරීමට සහ ගැටලු විසඳීම තුළින් සංවිධාන තුළ වටිනාකමක් නිර්මාණය කිරීමට පහසුකම් සපයයි.
පර්යේෂණ මධ්‍යස්ථානයේ භෞතික සම්පත් අතරට කුටි 03 ක්, පොදු ප්‍රදේශයක්, උපදේශන කාමරයක් සහ අධ්‍යයන ප්‍රදේශයක් ඇතුළත් වේ. ගුණාත්මක හා ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය සඳහා භාවිතා කරන මෘදුකාංග වලින් සමන්විත පරිගණක 04 ක් ද එය සතුය.

ආයතනය විසින් ප්‍රකාශයට පත්කරන ප්‍රකාශන

Sri Lankan Journal of Management (SLJM)

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය විසින් "කළමනාකරණ" ක්ෂේත්‍රය තුළ ශාස්ත්‍රීය ක්ෂේත්‍රයට නව දැනුමක් එක් කිරීමේ සහ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ පීඨ සාමාජිකයින්ගේ බුද්ධිමය දායකත්වය (IC) වැඩි දියුණු කිරීමේ අරමුණ ඇතිව 1996 වසරේදී Sri Lankan Journal of Management සඟරාව (SLJM) හඳුන්වා දෙන ලදී. කලමනාකරණ පශ්චාත් උපාධි ආයතනය විසින් වසර 28 ක් අඛණ්ඩව ප්‍රකාශයට පත් කර ඇති SLJM, දෙපාර්ශවය නොහඳුනන සමාලෝචනයක් සිදුකෙරෙන සඟරාවක් වන මෙය ශ්‍රී ලංකාවේ සීමාවන් දක්වා ළඟා වී ඇත. විශේෂයෙන් EBSCOhost දත්ත සමුදාය මගින් සුවිගත කර ඇත.

සංවිධාන තුළ ඇති පුළුල් පරාසයක ගැටළු ආමන්ත්‍රණය කරන න්‍යායාත්මකව පදනම් වූ පර්යේෂණ ප්‍රකාශයට පත් කිරීම සඳහා මෙම සඟරාව කැපවී සිටී. ගුණාත්මක, ප්‍රමාණාත්මක මෙන්ම සමාලෝචන සහ සංකල්පීය ප්‍රවේශයන් වැනි ක්‍රමවේද රැසකින් දැඩි පර්යේෂණ එයට පිළිගනී. ශාස්ත්‍රඥයින්ට සහ කර්මාන්ත පාදක පර්යේෂකයන්ට ඔවුන්ගේ පර්යේෂණ සොයාගැනීම් ප්‍රකාශයට පත් කිරීමට SLJM අවස්ථා සපයයි.

1996 සිට, SLJM සඳහා වසරකට කලාප 2 ක් සහිත අඛණ්ඩ ප්‍රකාශන ඉතිහාසයක් ඇති අතර, මේ වනවිට නිකුතුවකට ලිපි 05 ක් බැගින් වසරකට ලිපි 10 ක් ප්‍රකාශයට පත් කෙරේ. විවිධ කාල වකවානුවලදී උගත් කතුවරුන් කිහිප දෙනෙකු SLJM හි සේවය කර ඇති අතර, ප්‍රධාන වශයෙන් මානව සම්පත් (HR) සහ ආයතනික හැසිරීම් (OB) ආශ්‍රිත ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරමින් ප්‍රකාශනවල ගුණාත්මකභාවය සහ ආචාර ධර්ම පවත්වා ගෙන ගොස් ඇත. කෙසේ වෙතත්, 2022 සිට, අලෙවිකරණය, තිරසාරභාවය, පාලනය, උපායමාර්ගික කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණ කළමනාකරණය දක්වා ප්‍රකාශන ක්ෂේත්‍ර කළමනාකරණ වර්ගීකරණ විධි තුළ පුළුල් කරන ලදී.

Professional Manager

“Professional Manager” යනු ආයතනයේ අර්ධවාර්ෂික ප්‍රකාශනයකි. සඟරාවේ ප්‍රධාන අභිප්‍රාය වන්නේ හොඳම කළමනාකරණ චින්තනය සහ භාවිතයන් පිළිබඳ අති නවීන දැනුම සහ වැදගත් ලෙස කළ යුතු ආකාරය පිළිබඳ දැනුම බෙදා හැරීමයි.. පර්යේෂණ පාදක SLJM සඟරාවට වඩා “Professional Manager” වෙනස් වන්නේ එය කළමනාකරුවන්හට තමන් වටා ඇති දේ සහ ඇත්ත වශයෙන්ම ඔවුන් තුළ ඇති දේ දැකිය යුතු ආකාරය පිළිබඳ ක්ෂණික අදාළත්වයක් ඇති ප්‍රයෝජනවත් දැනුමක් ලබා දීමට උත්සාහ කරන බැවිනි.

“Professional Manager” සඟරාවේ දක්නට ලැබෙන තවත් ලක්ෂණයක් වන්නේ, රූප සටහන්, නිදර්ශන සහ පින්තූර මගින් ලිවීම් සහ දෘශ්‍ය පැහැදිලි කිරීම් සියුම්ලෙස මිශ්‍රකර පවත්වා ගැනීමට දරන උත්සාහයයි. මෙම සම්මිශ්‍රණය සඟරාව වර්ණවත් ප්‍රකාශනයක් බවට පෙරලා ඇති අතර ඇත්ත වශයෙන්ම, සම මට්ටමේ ප්‍රකාශන අතර අනන්‍යතාවයක් ඇති කිරීමට මෙම සම්මිශ්‍රණය දායක වී ඇත. ශ්‍රී ලාංකික කළමනාකරණ ප්‍රජාවට උනන්දුව සහ වටිනාකම පිළිබඳ වත්මන් දැනුම ලබා දීමේ අරමුණින් ප්‍රකාශයට පත් කෙරෙන “Professional Manager” සඟරාව කියවීමට පහසු ශෛලියකින් ලියා ඇත්තේ නිසා ඔවුන්ගේ කාර්යබහුල වැඩ කාලසටහන් මධ්‍යයේ කියවීමට අපේක්ෂාවෙනි. “Professional Manager” සඟරාවේ 21 වන නිකුතුවේ කතුවැකි පිටුව උපුටා දක්වන්නේ නම්, ‘මෙය වෘත්තීය කළමනාකරුවන් සඳහා වෘත්තීය කළමනාකරුවන්ගෙන් යුත් සඟරාවකි.” (‘this is a magazine by professional managers for professional managers.) ඇත්ත වශයෙන්ම, එහි අවසාන අරමුණ වන්නේ අපගේ අභිලාෂයන්ට වඩාත් සමාන හා මිත්‍රශීලී කළමනාකරණ සංස්කෘතියක් හරහා අපගේ සංවිධානවල

කටයුතු හැසිරවීමේදී වඩාත් පහසු වන ශ්‍රී ලාංකික වෘත්තීය කළමනාකරුවෙකු ප්‍රවර්ධනය කිරීමයි. මේ අනුව, ‘‘Professional Manager’’ කළමනාකරණය පිළිබඳ සරල පෙළපොතකට වඩා ඔබ්බට යයි. 2024 දී “Professional Manager’’ හි කලාප දෙකක් ප්‍රකාශයට පත් කරන ලදී.



කලමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ඉදිරිපත් කිරීමේ මාර්ගෝපදේශ (Presentation Guidelines)

කීර්තිමත් උසස් අධ්‍යාපන ආයතනයක කැපී පෙනෙන ලක්ෂණය ඒවා ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම සහ උත්ශ්‍රේණිගතකිරීම සඳහා සිය අධ්‍යයන සහ මෙහෙයුම් අඛණ්ඩව භාවිතා කිරීමයි. කලමනාකරණ පශ්චාත් උපාධි ආයතනය වසර ගණනාවක් පුරා සිය ප්‍රමිතීන් සමාලෝචනය කිරීම, තක්සේරු කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා තමන්ගේම පරාවර්තක ප්‍රවේශයක් වර්ධනය කර ගෙන ඇත. කලමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ඉදිරිපත් කිරීමේ මාර්ගෝපදේශ, කාලානුරූපී උත්ශ්‍රේණි කිරීමේ මෙම විෂය පථයට අයත් වන අතර, ස්වයං-වැඩිදියුණු කිරීම සඳහා වූ මෙම ප්‍රවේශය මෙම ප්‍රකාශනයට සිදු කරන ලද සංශෝධන ගණනින් පැහැදිලිව පෙනේ.

පර්යේෂණ ප්‍රකාශන ඇතුළු ශාස්ත්‍රීය ලේඛන වසර ගණනාවක් තිස්සේ සිය මූලාරම්භක මධ්‍යස්ථානවලින් ඔබ්බට ගමන්කිරීම හේතුවෙන් මෙම ලේඛන සඳහා පුළුල් ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන් මත පදනම් වූ පොදු රාමුවක් අවශ්‍ය වේ. එබැවින්, මෙම ආයතන, ප්‍රසිද්ධ ජාත්‍යන්තර මධ්‍යස්ථාන විසින් සකස් කර ඇති විශේෂිත මාර්ගෝපදේශ අනුව යමින්, සිය අධ්‍යයන කටයුතු සහ ඉගෙනුම් ප්‍රජාවන් විසින් අනුගමනය කළ යුතු ඔවුන්ගේ ආයතනයටම-නිශ්චිත මාර්ගෝපදේශ සකස් කරගෙන ඇත. මෙම ප්‍රයත්නයේ දී, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය විශේෂයෙන් අරමුණු කරන්නේ, ආරම්භක අවධියේ පටන් සිය අධ්‍යයන කණ්ඩායම්වල ලේඛනවල වාර්තා සහ පැවරුම් සංයුතියට ක්‍රමවත් බවක් ලබාදීම මගින් ඔවුන්ගේ අධ්‍යයන ලේඛන ශික්ෂණය කර අවසානයේ දී ඉහළ මට්ටමේ ප්‍රකාශන කරා ගෙන ඒමයි.

කලමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ඉදිරිපත් කිරීමේ මාර්ගෝපදේශවල සංස්කරණ මාලාවේ 7 වන සංස්කරණය වන වත්මන් සංස්කරණය ප්‍රකාශයට පත් කිරීමේදී , පීඨයේ සහ අනෙකුත් කොටස්කරුවන්ගේ සියලු අදහස්, වත්මන් ජාත්‍යන්තර ප්‍රමිතීන් මෙන්ම අධ්‍යයන ලේඛනවල එක්වරම සිදුවන අනාගත ප්‍රවණතා වැඩිදියුණු කිරීම් ක්‍රියාත්මක කිරීමේදී ප්‍රවේශමෙන් සලකා බලා ඇත. එහි සංශෝධනයේ අවසාන අදියෙර්දී පවා මෙම ශාස්ත්‍රපීඨයේ අතිමහත් අත්දැකීම් සම්භාරයද සංචිත කර තිබීම, අපගේ ශාස්ත්‍රීය ලේඛනවලට ක්‍රමානුකූලභාවයක් සහ පිළිවෙලක් ගෙන ඒම සඳහා සාමූහික උත්සාහයක් වන අතර, එය විශේෂයෙන් ඉගෙනුම් ප්‍රජාවට හොඳ ස්ථාවරයක් වනු ඇත, මන්ද ඔවුන්ට දැන් ඔවුන්ගේ සියලුම ලේඛනවල අනුගමනය කිරීමට

මාර්ගෝපදේශ රාශියක් ඇත.

PIM Cases in Management

" PIM Cases in Management" හි ප්‍රකාශයට පත් කර ඇති සිද්ධි, ප්‍රධාන වශයෙන් සකස් කර ඇත්තේ වශයෙන්ම ඉගෙනුම් හවුල්කරුවන් විසින් ඔවුන්ගේ අවසන් වසරේ ව්‍යාපෘති ලෙස සකස් කළ ඒවා අතුරින් ප්‍රවේශමෙන් තෝරාගනීමෙන් වන අතර ඒවා, පීඨය විසින් මනාලෙස අධීක්ෂණය කරනු ලැබේ.

ප්‍රකාශනයේ දක්වා ඇති සිද්ධීන් වනුයේ,

Case 1: Creating Shared Value through ‘Prajna’

Case 2: Exploring Elegance in Elephant Dung

Case3: Mega Heights of Multi Constructions

Case 4: Showcasing Excellence in Enterprise Technology Sphere

Case 5: Venturing in Stormy Seas with Changing Captains

Case 6: Educational Brilliance in Banking and Finance

Case 7: Baking the Local Delights in the Burgeoning Dessert

Case 8: Magnificently Serving Millions without Millionaires

Case 9: A Road less travelled with Business Excellence by Eggs

Case 10: Flying high with People at Airport and Aviation Services

අභ්‍යන්තර විගණන අංශය

අභ්‍යන්තර විගණන අංශයේ ව්‍යුහය සහ කාර්යයන්

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශය, වාර්ෂික විගණන සැලැස්මකට අනුව, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුයුක්තව සිටින කාර්ය මණ්ඩලය සමඟ විගණන කටයුතු සිදු කරනු ලබයි. ඊට අමතරව, 2024 වසර සඳහා විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් නිදහස් කිරීම, පාරිතෝෂික ගෙවීම සහ විශ්‍රාම වැටුප් නිදහස් කිරීම සඳහා අනිවාර්ය පූර්ව විගණන කටයුතු සම්පූර්ණ කිරීම ද සිදු කරනු ලබයි.

විගණන කමිටුව

2024 වර්ෂය සඳහා පත් කරන ලද විගණන කමිටුව, පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනයේ (PIM) විධායක නොවන, ස්වාධීන පාලක මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත වේ. 2024 වර්ෂයේ දී, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අධ්‍යක්ෂ, ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, නියෝජ්‍ය මූල්‍යාධිකාරී, නියෝජ්‍ය අභ්‍යන්තර විගණක සහ අදාළ පරිපාලන කාර්ය මණ්ඩලයේ සහභාගීත්වයෙන් විගණන කමිටු රැස්වීම් හතරක් (04) පවත්වන ලදී. ශ්‍රී ලංකා විගණකාධිපතිවරයාගේ නියෝජිතයා වන ජාතික විගණන කාර්යාලයේ ආයතනවල විගණන අධිකාරීවරයා ද සහභාගී විය. විගණන කමිටුව යහපාලනය සඳහා වන රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශවල නිශ්චිතව දක්වා ඇති විෂය පථයට අනුව එහි රාජකාරි ඉටු කරන අතර මූල්‍ය කළමනාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධති ශක්තිමත් කිරීම සහ ආයතනයේ පරිපාලන ක්‍රියා පටිපාටි වැඩිදියුණු කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කරනු ලබයි.

ප්‍රගතිය

සමාලෝචිත වර්ෂය තුළ, විගණන කමිටුව විසින් ආයතනයේ අභ්‍යන්තර පාලනයන් සහ ක්‍රියාවලීන් ශක්තිමත් කිරීම සඳහා හේතු පාදක වූ නිර්දේශ, උපදෙස් සහ යෝජනා කිහිපයක් ඉදිරිපත් කර ඇති අතර ඒවා අතර පහත සඳහන් දෑ ඇතුළත් වේ.

අ) මූල්‍ය ප්‍රකාශනයේ අඛණ්ඩතාව සහතික කිරීම,

ආ) අදාළ ගිණුම්කරණ සහ මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් ඇතුළුව නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල වීම නිරීක්ෂණය කිරීම සඳහා ආයතනය පද්ධතියක් පවත්වාගෙන යන බව සහතික කිරීම,

ඇ) අභ්‍යන්තර විගණන කාර්යයන්හි සමස්ත අධීක්ෂණය සහ වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන සැලැස්ම අනුමත කිරීම,

විගණන කමිටුව මගින් විගණකාධිපතිවරයාගේ නියෝජිතයා සමඟ කටයුතු කර, විගණකාධිපතිවරයාගේ වාර්තාවල හඳුනාගත් දුර්වලතා සහ අඩුපාඩු පිළිබඳව පසු විපරම් ක්‍රියාමාර්ග ගන්නා ලෙස නිලධාරීන්ට සහ අභ්‍යන්තර විගණකට උපදෙස් දෙන ලදී.

අනාගත ප්‍රගතිය


ආයතනයේ පද්ධති සහ පාලන ක්‍රමවල අඛණ්ඩ වැඩිදියුණු කිරීම් හේතුවෙන්, මෙම පද්ධති සහ පාලන ක්‍රම සමාලෝචනය කිරීම සහ ආයතනයේ අභ්‍යන්තර පාලනය, මූල්‍ය සහ පරිපාලන ක්‍රියා පටිපාටි තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා නිර්දේශ ලබා දීම සඳහා විගණන කමිටුව තම කාර්යභාරය ඉටුකිරීමට සැලසුම් කරයි.

සමස්ත මූල්‍ය සමාලෝචනය


මූල්‍ය දළ විශ්ලේෂණය

ආදායම

පසුගිය වසරට සාපේක්ෂව කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය (PIM) තරමක් වැඩි මුළු ආදායමක් 2024 දී වාර්තා කළ අතර එය 2023 වසරට සාපේක්ෂව 5% ක සමස්ත වැඩිවීමකි. මෙම වර්ධනයට සඳහා විධායක සංවර්ධන වැඩසටහන්, පාඨමාලා ගාස්තුවලින් උපයන ආදායම හේතු විය හැකි අතර ඊට අමතරව, ස්ථාවර තැන්පතුවල ආයෝජනය කරන ලද පොලී ආදායමෙන් ද සැලකිය යුතු දායකත්වයක් ලැබුණි.




ක්‍රියාකාරකම් වලින් ලද දළ ආදායම (රු.මි.)



වියදම්


ශ්‍රී ලංකාවේ තත්ත්වය මත අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා මිල ගණන් ඉහළ යාමත් සමඟ, වසර තුළ මෙහෙයුම් වියදම් කෙරෙහි සෘණාත්මක බලපෑමක් ඇති කළේය. මුළු වියදම 2023 වර්ෂයට වඩා 16% කින් වැඩි විය.

වියදම් සාරාංශය (රු.මි.)




මහා භාණ්ඩාගාරයට අය කරන බද්ද

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය (PIM) යනු ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධ වෙනම ආඥා පනතක් මගින් පාලනය වන ස්වයං-මූල්‍ය සහ අර්ධ-ස්වාධීන ආයතනයකි. කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය (PIM) 1998 සිට එහි ස්වයං-මූල්‍ය තත්ත්වය පවත්වා ගෙන යන අතර වසර ගණනාවක් තිස්සේ මහා භාණ්ඩාගාරයේ ඒකාබද්ධ අරමුදලට දායක වී ඇත. 2024 දී මහා භාණ්ඩාගාරයට මාරු කරන ලද බද්ද රුපියල් මිලියන 20 ක් වූ අතර 2023 දී එය රුපියල් මිලියන 29 ක් වූ අතර අතිරික්තයේ ප්‍රතිශතය ලෙස එය පිළිවෙලින් 38% සහ 32% ක් විය.



ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතාවය

සමාලෝචිත වර්ෂය තුළ මුළු වත්කම් 6% කින් ඉහළ ගොස් රුපියල් මිලියන 84ක් විය. ජංගම නොවන වත්කම් 9% කින් වර්ධනය වූ අතර, ජංගම වත්කම් 2% කින් අඩු විය. තවද, තමන්ගේම ආදායම සහ සංචිත මගින් අරමුදල් සපයන ලද රුපියල් මිලියන 136ක දේපළ කම්හල් සහ උපකරණ (PPE) වටිනාකම 29% කින් ඉහළ ගොස් තිබේ.



පුනරාවර්තන වියදම්

විෂය	**2022** නැවත ප්‍රකාශිත අගය (රු)	**2023** නැවත ප්‍රකාශිත අගය (රු)	**2024** (රු)
පුද්ගල පඩිනඩි	108,378,750	119,934,976	127,079,846
ගමනාගමනය	7,136,800	10,555,254	11,707,070
සැපයුම්	26,471,594	37,540,628	30,738,469
නඩත්තු	5,712,615	7,827,866	13,056,107
කොන්ත්‍රාත් සේවා	26,858,991	50,102,822	53,564,979
වෙනත්	156,190,460	181,544,882	234,647,525
	330,749,210	407,506,427	470,793,996

ප්‍රාග්ධන වියදම්

විෂය	**2022** නැවත ප්‍රකාශිත අගය (රු)	**2023** නැවත ප්‍රකාශිත අගය (රු)	**2024** (රු)
ගෘහභාණ්ඩ සහ කාර්යාල උපකරණ අත්පත්කරගැනීම	16,519,902	13,627,317	140,440,908
ගොඩනැගිලි සහ ව්‍යුහයන් අත්පත්කරගැනීම	-	276,609,565	5,713,627
වෙනත් (පුස්තකාල පොත්, මෝටර් වාහන, උපාධි ලෝගු)	109,857	553,761	3,460,158
අස්පෘෂ්‍ය වත්කම් අත්පත්කරගැනීම	150,000	244,785	549,000
	16,779,758	291,035,428	150,163,693

මූල්‍ය ප්‍රගතිය (වියදම්)

විෂය	**2024** අයවැය රු.	**2024** වියදම රු.	ඉතිරිය (අතිරික්තය) රු.
අ) ව්‍යාපෘති හැර පුනරාවර්තන	440,130,000	470,793,996	(30,663,996)
ආ) ව්‍යාපෘති හැර ප්‍රාග්ධන	427,430,000	150,163,693	277,266,307
එකතුව	867,560,000	620,957,689	246,602,311

රු.30,595,000/- ක් වන ඉදිකිරීම් ව්‍යාපෘති ප්‍රතිපාදන ඉහත (ආ) හි අන්තර්ගත නොවේ.

මූල්‍ය ප්‍රගතිය (උත්පාදිත ආදායම)

ආදායම් ප්‍රභවය	2024 අයවැය රු.	2024 දී එකතු වූ මුදල රු.	හිඟය/අතිරික්තය රු.
පශ්චාත් උපාධි අධ්‍යන	315,812,000	342,394,179	26,582,179
උපදේශන	30,000,000	78,095,602	48,095,602
වෙනත්	43,605,000	103,738,741	60,133,741
	389,417,000	524,228,522	134,811,522

පසුගිය වසර 10 තුළ මූල්‍යමය සුවිශේෂ අවස්ථා (අගය රු. වලින්)

ආදායම

විෂය	2015	2016	2017	2018	2019	2020	2021	2022	2023	2024
රජයේ ප්‍රදාන	-	-	-	-	-	-	-	-	-	-
ස්වයං උත්පාදන ආදායම	191,683,689.57	331,652,333.55	420,177,065.00	485,214,846.00	433,820,242	334,375,102	297,633,138	391,779,849	373,464,467	437,388,593
ආයෝජන ආදායම	13,620,829.32	21,203,276.86	39,154,154.00	52,016,602.00	61,867,510	48,165,182	37,000,362	85,184,792	109,210,003	71,617,511
එකතුව	**205,304,519**	**352,855,610**	**459,331,219**	**537,231,448**	**495,687,752**	**382,540,284**	**334,633,500**	**476,964,641**	**482,674,470**	**509,006,104**

පුනරාවර්තන වියදම්

විෂය	2015	2016	2017	2018	2019	2020	2021	2022	2023	2024
පුද්ගල පඩිනඩි	52,032,035	69,162,110	82,528,860	87,705,538	123,881,631	88,104,828	90,171,706	108,378,750	119,934,976	127,079,846
ගමන් වියදම්	3,075,082	4,974,974	7,534,844	6,042,160	42,666,852	5,112,291	5,331,530	7,136,800	10,555,254	11,707,070
සැපයුම්	8,597,401	21,337,740	18,892,095	12,843,811	20,815,478	9,887,879	16,326,131	26,471,594	37,540,628	30,738,469
නඩත්තු	7,218,452	5,775,470	8,017,626	6,583,545	9,632,163	4,476,686	2,097,073	5,712,615	7,827,866	13,056,107
කොන්ත්‍රාත් සේවා	23,091,955	29,039,573	37,463,012	42,073,601	37,185,095	20,789,161	18,769,215	26,858,991	50,102,822	53,564,979
වෙනත්	71,234,707	130,199,259	182,433,215	245,897,787	183,156,258	82,369,229	103,981,559	156,190,460	181,544,882	234,647,525
භාණ්ඩාගාරයට ගෙවන ලද බද්ද	-	-	-	-	-	-	-	50,000,000	29,000,000	20,000,000
එකතුව	**165,249,632**	**260,489,127**	**336,869,653**	**401,146,443**	**417,337,477**	**210,740,073**	**236,677,214**	**380,749,210**	**436,506,427**	**490,793,996**

ප්‍රාග්ධන වියදම

විෂය	2015	2016	2017	2018	2019	2020	2021	2022	2023	2024
ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ අත්පත් කර ගැනීම	6,707,790	8,512,908	7,682,968	11,460,534	9,152,780	3,369,956	5,626,800	16,519,902	13,627,317	140,440,908
යන්ත්‍ර සූත්‍ර අත්පත් කර ගැනීම	-	-	-	52,112	-	-	-	-	-	-
ඉදිකිරීම්	-	417,840	-	-	-	-	-	-	276,609,565	20,180,134
පුස්තකාල පොත්, මෝටර් වාහන, උපාධි ලෝගු	7,032,868	231,009	146,516	584,172	804,290	1,064,012	421,305	109,857	553,761	3,460,158
අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම	-	-	-	1,950,000	-	590,000	-	150,000	244,785	549,000
එකතුව	**13,740,658**	**9,161,757**	**7,829,484**	**14,046,818**	**9,957,070**	**5,023,968**	**6,048,105**	**16,779,758**	**291,035,428**	**164,630,200**

පසුගිය වසර 10 තුළ මූල්‍ය වියදම් (රු.)

විෂය	2015	2016	2017	2018	2019	2020	2021	2022	2023	2024
ප්‍රාග්ධන වියදම	13,740,658	9,161,757	7,829,484	14,046,818	9,957,070	5,023,968	6,048,105	16,779,758	291,035,428	470,793,996
පුනරාවර්තන වියදම	165,249,632	260,489,127	336,869,653	401,146,443	417,337,477	210,740,073	236,677,214	380,749,210	436,506,427	150,163,693
එකතුව	**178,990,290**	**269,650,884**	**344,699,137**	**415,193,261**	**427,294,547**	**215,764,041**	**242,725,319**	**397,528,968**	**727,541,855**	**620,957,689**

මූල්‍ය ප්‍රකාශන



2024 දෙසැම්බර් 31
දිනෙන් අවසන් වූ වර්ෂය
සඳහා මූල්‍ය ප්‍රකාශන

Postgraduate Institute of Management
University of Sri Jayewardenepura

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
28, ලෙස්ලි රණගල මාවත, කොළඹ 8, ශ්‍රී ලංකාව.

දුරකථන:+94 11 2 689 639
ෆැක්ස්:+94 11 2 689 643
වෙබ්:www.pim.sjp.ac.lk
විද්‍යුත් තැපෑල: admin@pim.sjp.ac.lk

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
306/02, පොල්දූව පාර බත්තරමුල්ල

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන-
කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය (PIM)
මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකාරීත්වයේ අභිනියෝජනය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන විගණනයට අදාළව අපි මෙම ලිපිය ලබා දෙන්නේ ශ්‍රී කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය, මෙහෙයුම් ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහයන් සෑම කරුණකින්ම සාධාරණ ලෙස පවතින්නේද යන්න පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහාය. ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය තත්ත්වය, මෙහෙයුම් ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහයන් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල සාධාරණ ඉදිරිපත් කිරීම සඳහා අප වගකිව යුතු බව අපි තහවුරු කරමු.

මෙම ලිපියේ ඇතැම් නිරූපණ වැදගත් කරුණුවලට සීමා වේ. අවට තත්ත්වයන් අනුව, තොරතුරු මත විශ්වාසය තබන සාධාරණ පුද්ගලයෙකුගේ විනිශ්චය මඟ හැරීම හෝ වැරදි ප්‍රකාශය මගින් වෙනස් වීමට හෝ බලපෑම් කිරීමට ඉඩ ඇති ගිණුම්කරණ තොරතුරු අතපසුවීමක් හෝ වැරදි ප්‍රකාශයක් ඇතුළත් වන්නේ නම්, ප්‍රමාණය නොසලකා වැදගත් කරුණු ලෙස සැලකේ.

අපගේ දැනුම සහ විශ්වාසය අනුව, විගණනය අතරතුර ඔබ වෙත කරන ලද පහත දැක්වෙන නියෝජන අපි තහවුරු කරමු.

1. ඉහත සඳහන් කළ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සාධාරණ ලෙස ඉදිරිපත් කර ඇති අතර පෙර වසරට අනුකූලව සකස් කර ඇත.

2. පහත සියල්ල විගණකාධිපති වෙත ලබා දී ඇත:

අ. විගණකාධිපතිවරයා විසින් ඉල්ලා සිටින මූල්‍ය වාර්තා සහ අනෙකුත් තොරතුරු
ආ. කළමනාකරණ මණ්ඩලයේ සහ අධ්‍යක්ෂවරුන්ගේ කමිටු රැස්වීම්වල වාර්තා හෝ වාර්තා තවමත් සකස් කර නොමැති මෑත කාලීන රැස්වීම්වල ක්‍රියාවන්ගේ සාරාංශ.

3. මූල්‍ය හෝ වෙනත් වාර්තාකරණ පිළිවෙත්වලට අනුකූල නොවීම හෝ අඩුපාඩු සම්බන්ධයෙන් නියාමන ආයතනවලින් කිසිදු දැනුම්දීමක් කර නොමැත.

4. මූල්‍ය ප්‍රකාශන වලට පාදක වන ගිණුම් වාර්තා වල නිසි ලෙස සටහන් කර නොමැති වැදගත් ගනුදෙනු නොමැත.

5. පහත සඳහන් දේ නොමැත:

අ. අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු කාර්යභාරයක් ඇති කළමනාකාරිත්වය හෝ සේවකයින් සම්බන්ධ වංචාවන්

ආ. මූල්‍ය ප්‍රකාශනවලට සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි වෙනත් අය සම්බන්ධ වංචාවන්.

6. වත්කම් සහ වගකීම් දරණ වටිනාකමට හෝ වර්ගීකරණයට සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි කිසිදු සැලසුමක් හෝ අභිප්‍රායක් ආයතනයට නොමැත.

7. ආයතනය සහ සෘජු හෝ වක්‍ර උනන්දුවක් ඇති කළමනාකරණ මණ්ඩලයේ ඕනෑම සාමාජිකයෙකු අතර ඇති කර ගත් සියලුම කොන්ත්‍රාත්තු මෙහි ඇමුණුම I දක්වා ඇත.

8. මූල්‍ය ප්‍රකාශනවල පහත සඳහන් දෑ නිසි ලෙස සටහන් කර හෝ අනාවරණය කර ඇත.

අ. විකුණුම්, මිලදී ගැනීම්, ණය, මාරු කිරීම්, කල්බදු විධිවිධාන, සහ ඇපකර, සහ අදාළ පාර්ශවයන්ගෙන් ලැබිය යුතු හෝ ගෙවිය යුතු මුදල් ඇතුළුව අදාළ පාර්ශ්ව ගනුදෙනු.

ආ. ලිඛිතව හෝ වාචිකව හෝ ආයතනය අවිනිශ්චිතව වගකීම් දරන වගකීම්.

9. පහත සඳහන් දෑ නොමැත:

අ. හදිසි අවස්ථාවක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම සඳහා සලකා බැලිය යුතු වන නීති හෝ රෙගුලාසි උල්ලංඝනය කිරීම් හෝ විය හැකි උල්ලංඝනය කිරීම්, ඒවායේ බලපෑම් .

ආ. ප්‍රකාශ කිරීමට ඉඩ ඇති බවට අපගේ නීතිඥවරයා අපට උපදෙස් දී ඇති තහවුරු නොකළ හිමිකම් හෝ තක්සේරු කිරීම් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීම.

ඇ. උපචිත හෝ හෙළිදරව් කිරීමට අවශ්‍ය වන වෙනත් වගකීම් හෝ ලාභ හෝ අලාභ අනපේක්ෂිත තත්ත්වයන්.

ඈ ආයතනයේ අවිචින්න පැවැත්ම පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි සිදුවීම් හෝ කොන්දේසි සම්බන්ධ සැලකිය යුතු අවිනිශ්චිතතාවයක් පවතින අවස්ථා.

10. අනුකූල අවස්ථාවක මූල්‍ය ප්‍රකාශනවලට ප්‍රමාණාත්මක බලපෑමක් ඇති කළ හැකි කොන්ත්‍රාත් ගිවිසුම්වල සියලුම අංගවලට අනුකූලව ආයතනය කටයුතු කර ඇත.

අපගේ දැනුමේ සහ විශ්වාසය පරිදි, ශේෂ පත්‍ර දිනයෙන් පසුව සහ මෙම ලිපියේ දිනය තෙක් ඉහත සඳහන් කළ මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම් කිරීමට හෝ හෙළිදරව් කිරීම අවශ්‍ය වන සිදුවීම් කිසිවක් සිදුවී නොමැත.

අත්සන් කළේ / ආචාර්ය ඒ.එන්. රණසිංහ
අධ්‍යක්ෂ
කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය
සභාපති, කළමනාකරණ මණ්ඩලය

අත්සන් කළේ / විනෝතා වනීතන්
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී

අත්සන් කළේ / ජේ.ඩී.ජී. සේනානායක
කළමනාකරණ මණ්ඩල සාමාජික

අත්සන් කළේ / ඩබ්.එම්.කේ.එන්. බණ්ඩාර
නියෝජ්‍ය මූල්‍යාධිකාරී

2025 ජූලි 21වන දින

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

රු.

	සටහන	2024	නැවත ප්‍රකාශිත අගය 2023
අයභාරය			
පාඨමාලා ගාස්තු	**01**	342,394,179	317,184,166
විධායක සංවර්ධන වැඩසටහන් වලින් ලැබෙන ආදායම		56,520,602	57,701,568
ජාත්‍යන්තර පුහුණු පාඨමාලා		20,425,000	-
උපාධි ප්‍රදානෝත්සව ගාස්තු		5,940,850	3,959,400
කළමනාකරණ පර්යේෂණ උපදේශනය		1,150,000	-
නැවත ලියාපදිංචි කිරීමේ ගාස්තු		1,076,875	1,742,400
විභාග ගාස්තු		868,000	1,135,100
අයදුම්පත් ගාස්තු		-	13,500
වැඩමුළු ගාස්තු		539,047	-
වෙනත් ආදායම්	**02**	95,313,969	115,413,365
මුළු අයභාරය		524,228,522	**497,149,500**
වියදම			
විධායක සංවර්ධන වැඩසටහන්		36,781,724	44,865,241
ජාත්‍යන්තර පුහුණු වැඩසටහන්		17,491,102	-
කළමනාකරණ පර්යේෂණ උපදේශනය		676,125	-
පුද්ගල පඩිනඩි	**03**	127,079,846	119,934,976
ගමන් වියදම් හා යැපුම් දීමනා	**03**	11,707,070	10,555,254
සැපයුම්	**03**	30,738,469	37,540,628
නඩත්තු	**03**	13,056,107	7,827,866
කොන්ත්‍රාත් සේවා	**03**	53,564,979	50,102,822
වෙනත් පුනරාවර්තන වියදම්	**03**	86,514,336	74,166,448
විදේශ වැඩසටහන් වියදම්	**03**	32,255,530	16,533,960
ප්‍රකාශන සඳහා වියදම		3,147,293	532,200
ක්ෂයවීම් සහක්‍රමක්ෂය		28,888,837	16,677,261
විගණන ගාස්තුව		700,000	1,389,600
කපා හැරීම් - ලැබිය යුතු පාඨමාලා ගාස්තු ශේෂයන්	**03-A**	27,092,578	26,030,217
ලබා දුන් ශිෂ්‍යත්ව		1,100,000	1,350,000
මුළු වියදම		470,793,996	407,506,472
භාණ්ඩාගාරයට බදු අය කිරීමට පෙර කාල සීමාව සඳහා අතිරික්තය / (හිඟය)		**53,434,526**	**89,506,472**
භාණ්ඩාගාරයට බදු		**(20,000,000)**	**(29,000,000)**
බදුවලින් පසු අතිරික්තය / (හිඟය)		**33,434,526**	**60,643,027**
වෙනත් විස්තීර්ණ ආදායම්			
විදේශ විනිමය ලැබීම් / (වැයවීම්)		(15,222,418)	(14,475,030)
ආයුගණක ලාභය/(අලාභය)		1,488,789	(4,158,063)
මුළු අනෙකුත් විස්තීර්ණ ආදායම / (වියදම්)		**(13,733,629)**	**(18,633,092)**
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ අතිරික්තය / (හිඟය)		**19,700,897**	**42,009,935**

පිටුව **02**

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
2024 දෙසැම්බර් 31 දිනට

රු.

	සටහන	2024	නැවත ප්‍රකාශිත අගය 2023
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත සහ උපකරණ	**04**	601,257,461	465,411,804
බලමුලු ගැන්වීමේ අත්තිකාරම	**05**	3,672,907	-
අස්පෘශ්‍ය වත්කම්	**06**	1,001,125	1,105,419
WIP A/C ව්‍යාපෘතිය -ගොඩනැගිලි අදියර II		-	54,827,091
ස්ථාවර තැන්පතු	**07**	546,957,845	539,991,952
මුළු ජංගම නොවන වත්කම්		1,152,889,338	1,061,336,266
ජංගම වත්කම්			
ගබඩා තොග	**08**	27,828,607	31,258,784
සැප. අත්තිකාරම A/C ව්‍යාපෘතිය -ගොඩනැගිලි අදියර II		-	1,630,089
අත්තිකාරම් සහ පෙර ගෙවීම්	**09**	9,406,833	10,464,923
ලැබිය යුතු දෑ	**10**	75,952,460	122,295,414
කෙටි කාලීන ස්ථාවර තැම්පතු	**11**	111,041,163	-
මුදල් සහ මුදල් සමාන දෑ	**12**	134,071,120	201,013,027
මුළු ජංගම වත්කම්		**358,300,183**	**366,662,237**
මුළු වත්කම්		**1,511,189,522**	**1,427,998,502**
ස්කන්ධය හා බැරකම්			
ස්කන්ධය			
ප්‍රාග්ධන ප්‍රදාන		166,986,090	166,986,090
ප්‍රත්‍යාගණන සංචිතය	**13**	177,734,566	177,734,566
පොදු සංචිතය		951,081,086	931,380,190
මුළු ස්කන්ධය		**1,295,801,741**	1,276,100,845
බැරකම්			
ජංගම නොවන බැරකම්			
අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ බැඳීම් සඳහා ප්‍රතිපාදන	**14**	13,918,860	14,557,202
පරිත්‍යාග අරමුදල	**15**	437,608	437,608
මුළු ජංගම නොවන බැරකම්		**14,356,467**	14,994,810
ජංගම බැරකම්			
ප්‍රතිපාදන	**16**	42,979,979	19,007,621
ආපසු ගෙවිය යුතු තැන්පතු	**17**	793,780	932,380
කලින් ලද ආදායම	**18**	113,492,914	65,672,260
වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ	**19**	37,705,325	39,468,350
රඳවාගැනීම්	**20**	6,059,315	11,822,236
මුළු ජංගම බැරකම්		**201,031,313**	**136,902,847**
මුළු බැරකම්		**215,387,780**	**151,897,658**
මුළු ස්කන්ධය සහ බැරකම්		**1,511,189,522**	**1,427,998,502**

ආයතනයේ ඉහත මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ සහ 2018 අංක 16 දරන කළමනාකරණ පශ්චාත් උපාධි ආයතන අඥා පනතේ අදාළ වගන්තිවල අවශ්‍යතාවලට අනුකූල වන බව අපි සහතික කරමු.

ඩබ්.එම්.කේ.එන්. බණ්ඩාර
නියෝජ්‍ය මූල්‍යාධිකාරි

විනෝතා වනීතන්
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳව කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් වගකිව යුතුය.

ආචාර්ය ඒ.එන්. රණසිංහ
කළමනාකරණ මණ්ඩලයේ සභාපති

ජේ.ඩී.ජී. සේනානායක
කළමනාකරණ මණ්ඩලයේ සාමාජික

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
හිමිකම වෙනස්වීමේ ප්‍රකාශය
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

රු.

	සටහන	ප්‍රාග්ධන ප්‍රදානය	ප්‍රත්‍යාගණන සංචිතය	පොදු සංචිතය	මුළු අගය
2022 ජනවාරි 1 වන දිනට ශේෂය	**21 -A**	166,986,090	177,734,566	790,561,618	1,135,282,273
විදේශ විනිමය ලාභය/(අලාභය)				43,948,184	43,948,184
කාල සීමාව සඳහා අතිරික්තය		-	-	52,364,318	52,364,318
ගණක ලාභය/(අලාභය)		-	-	4,071,134	4,071,134
EMBA 2021 ආදායම් ආපසු ගෙවීමේ නිවැරදි කිරීම		-	-	(1,500,000)	(1,500,000)
2023 ජනවාරි 1 වන දිනට ශේෂය		**166,986,090**	**177,734,566**	**889,445,254**	**1,234,165,909**
විදේශ විනිමය ලාභය/(අලාභය)				(14,475,030)	(14,475,030)
නැවත ස්ථාපිත කිරීමට පෙර කාල සීමාව සඳහා අතිරික්තය		-	-	76,383,206	76,383,206
නැවත ප්‍රකාශන	**21- B**	-	-	(15,740,178)	(15,740,178)
EMBA 2021 ආදායම් ආපසු ගෙවීමේ නිවැරදි කිරීම		-	-	(75,000)	(75,000)
ගණක ලාභය/(අලාභය)		-	-	(4,158,063)	(4,158,063)
2024 ජනවාරි 1 වන දිනට ශේෂය		**166,986,090**	**177,734,566**	**931,380,190**	**1,276,100,845**
විදේශ විනිමය ලාභය/(අලාභය)				(15,222,418)	(15,222,418)
කාලසීමාව සඳහා අතිරික්තය		-	-	33,434,526	33,434,526
ගණක ලාභය/(අලාභය)		-	-	1,488,789	1,488,789
2024 දෙසැම්බර් 31 දිනට ශේෂය		**166,986,090**	**177,734,566**	**951,081,086**	**1,295,801,741**

	ශ්‍රී ලංකා රු. නැවත ප්‍රකාශිත අගය	
	2024	**2023**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබෙන මුදල් ප්‍රවාහ		
බද්දෙන් පසු කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය/(හිඟය)	53,434,526	89,643,027
මුදල් නොවන භූවමාරු		
ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය	28,888,837	16,677,261
පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන	3,804,572	1,205,814
කාර්ය මණ්ඩල ණය වලින් ලැබෙන පොලී ආදායම	(825,005)	(133,144)
ස්ථාවර තැන්පතු වලින් ලැබෙන පොලී ආදායම	(71,617,511)	(109,210,003)
ශාලා ගාස්තු වලින් ලැබෙන ආදායම	(16,947,374)	(5,113,382)
විනිමය අනුපාත වෙනස් වීම හේතුවෙන්ලැබිය යුතු පාඨමාලා මුදල්	1,367,899	1,840,475
	(1,894,056)	**(5,089,951)**
කාරක ප්‍රාග්ධනයේ වෙනස්කම්		
බඩුතොග (වැඩි වීම)/අඩු වීම	3,430,177	(363,826)
අත්තිකාරම් සහ පෙරගෙවුම් (වැඩි වීම)/අඩු වීම	1,058,089	(7,683,431)
ලැබිය යුතු මුදල් (වැඩි වීම)/අඩු වීම	14,905,586	4,340,228
ආපසු ගෙවිය හැකි තැන්පතුවල වැඩිවීම/(අඩුවීම)	(138,600)	496,380
කලින් ලැබුණු ආදායමේ වැඩිවීම/(අඩුවීම)	47,820,654	(496,668)
වෙළඳාම සහ අනෙකුත් ගෙවිය යුතු දේවල වැඩිවීම/(අඩුවීම)	2,236,975	12,376,311
ප්‍රතිපාදනවල වැඩිවීම/(අඩුවීම)	3,972,358	10,169,444
	71,391,182	**13,748,486**
මහා භාණ්ඩාගාරය වෙත ගෙවීම	(4,000,000)	(25,000,000)
ගෙවන ලද පාරිතෝෂිකය	(2,954,126)	(1,200,000)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබෙන ශුද්ධ මුදල් ප්‍රවාහයන්	**64,437,057**	**(12,451,514)**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලැබෙන මුදල් ප්‍රවාහ		
දේපළ, යන්ත්‍රෝපකරණ සහ උපකරණ මිලදී ගැනීම	(53,526,159)	(14,388,987)
අස්පෘශ්‍ය වත්කම් මිලදී ගැනීම	(549,000)	(244,785)
ගොඩනැගිලි ඉදිකිරීම	(24,525,269)	(48,078,705)
වායු සමීකරණ ව්‍යාපෘතිය ගොඩනැගීම WIP	(34,399,515)	(41,170,239)
වැසිකිළි අලුත්වැඩියාව සහ ප්‍රතිසංස්කරණය - අත්තිකාරම් ගෙවා ඇත.	(3,672,907)	-
ශාලා ගාස්තු මත ආදායම	15,648,936	4,177,382
ස්ථාවර තැන්පතුවල ආයෝජන ආපසු ගැනීම	50,000,000	60,000,000
කෙටි කාලීන ස්ථාවර තැන්පතු වල ආයෝජනය කිරීම	(161,041,162)	-
ස්ථාවර තැන්පතු වල ආයෝජනය කිරීම	(6,965,893)	(69,550,370)
ණය සහ අත්තිකාරම් සඳහා පොලිය	825,005	133,144
ආයෝජන සඳහා පොලිය	95,083,525	111,730,203
සමුච්චිත ස්ථාවර තැන්පතු ආයෝජන සඳහා පොලිය	6,965,893	9,550,370
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලැබෙන ශුද්ධ මුදල් ප්‍රවාහයන්	**(116,156,547)**	**12,158,013**
මූල්‍යකරණ ක්‍රියාකාරකම් වලින් ලැබෙන මුදල් ප්‍රවාහ		
2021 (EMBA 2021) ට අදාළ ශිෂ්‍ය මුදල් ආපසු ගෙවීම	-	(75,000)
මූල්‍යකරණ ක්‍රියාකාරකම් වලින් ලැබෙන ශුද්ධ මුදල් ප්‍රවාහයන්	**-**	**(75,000)**
විදේශ විනිමය ලාභය/(අලාභය)	**(15,222,418)**	**(14,475,030)**
වසර තුළ මුදල් සහ මුදල් සමාන දෑවල ශුද්ධ වෙනස	**(66,941,908)**	**(14,843,531)**
වසර ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දේ	201,013,027	215,856,558
වසර අවසානයේ මුදල් සහ මුදල් සමාන දේ	**134,071,120**	**201,013,027**
මුදල් සහ මුදල් සමානතා විශ්ලේෂණය		
ලංකා බැංකුව - බොරැල්ල ශාඛාව - ගිණුම් අංක 192596	(6,736,299)	(4,244,613)
සම්පත් බැන්ක් පිඑල්සී ඇ.ඩෙ. ගිණුම් අංක 521830000070	85,633,194	129,858,059
බැංකු ගිණුම් - RFC (ජාත්‍යන්තර මධ්‍යස්ථානය) ගිණුම් අංක 9719360	5,597,146	34,180,886
බැංකු ගිණුම් අංකය (ජාත්‍යන්තර මධ්‍යස්ථානය) 021580683001	87,461	87,461
අරමුදල් කළමනාකරණ ගිණුම්	49,489,618	41,131,234
	134,071,120	**201,013,027**

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2024 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය

1. සාමාන්‍ය තොරතුරු, සකස් කිරීමේ පදනම සහ සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය.

1.1 වාර්තා කරන අස්ථිත්වය

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය (PIM) යනු 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ ආඥාපනත මගින් 1986 දී පිහිටුවන ලද ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධ අර්ධ ස්වයං පාලන ආයතනයකි. (2018 අංක 03 දරන ආඥාපනත මගින් සංශෝධනය කරන ලදී)

කළමනාකරණ සහ පරිපාලන අධ්‍යයනයන්හි විවිධ අංශවල පශ්චාත් උපාධි උපදෙස්, පුහුණුව, පර්යේෂණ සහ සංවර්ධනය සැපයීම තුළින් ශ්‍රී ලංකාවේ කළමනාකරණය පිළිබඳ උසස් අධ්‍යාපනය සහ වෘත්තීයභාවය ප්‍රවර්ධනය කිරීම එහි අරමුණු වේ.

ආයතනය එකවර සිසුන් 500 කට අධික සංඛ්‍යාවක් සඳහා පහසුකම් සපයන අතර එහි දේශන ශාලා, පීඨ කාමර, තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයක්, පුස්තකාලයක් සහ ආපන ශාලාවක් ද ඇත. පරිශ්‍රයේ, දේශන ශාලා සහ අධ්‍යාපනික උපකරණවල ගුණාත්මකභාවය සම්බන්ධයෙන් ආයතනය වෘත්තීය සහ නවීන දැක්මක් පවත්වාගෙන යයි.

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතියේ අද්විතීය උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය ස්වයං මූල්‍යනය වන අතර 1998 සිට එසේ පවතී. එතැන් පටන් එය ප්‍රාග්ධන හෝ පුනරාවර්තන වියදම් සඳහා ඒකාබද්ධ අරමුදලෙන් අරමුදල් ලබාගෙන නොමැත. කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය විසින් ව්‍යාපාර පරිපාලනපති පශ්චාත් (MBA) සහ රාජ්‍ය පරිපාලනපති පශ්චාත් (MPA) උපාධිධාරීන් සහ ඩිප්ලෝමාධාරීන් 6,700 කට අධික පිරිසක් බිහි කර ඇති අතර සංස්ථාපිත හා රාජ්‍ය ආයතනවලට විධායක අධ්‍යාපනය ලබා දෙයි.

1.2 මූල්‍ය ප්‍රකාශන සඳහා වන කළමනාකාරිත්ව වගකීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ අපක්ෂපාති ලෙස ඉදිරිපත් කිරීම සඳහා පාලක මණ්ඩලය (කළමනාකරණ මණ්ඩලය) වගකීම දරයි.

1.3 අනුකූලතා ප්‍රකාශ

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAS) අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති අතර, එම ප්‍රමිතීන් නොමැති අවස්ථාවන්හි දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS) අනුගමනය කර ඇත.

සංසන්දනාත්මක තොරතුරු

ආයතනය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව අදාළ කරගෙන ඇති අතර පූර්ව වසරවලදී ද එම ප්‍රතිපත්තිවලට අනුකූල වී ඇත. සංසන්දනය කිරීමේ අභිමතාර්ථය වෙනුවෙන් පෙර වසරේ සංඛ්‍යාලේඛන දක්වා ඇත.

1.4 දේපල, පිරියත සහ උපකරණ

(අ) පිරිවැය

පිරිවැයෙන් අඩු කළ සමුච්චිත ක්ෂයවීම්වල දේපල, පිරියත සහ උපකරණ වාර්තා කර ඇත.

(ආ) ක්ෂය වීම

ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය තුළ එවැනි මුදල් සමාන වාරිකවලින් කපා හැරීම සඳහා සින්නක්කර ඉඩම් හැර අනෙකුත් සියලුම දේපල, පිරියත සහ උපකරණවල පිරිවැය මත සරල රේඛීය ක්‍රමයක් භාවිතා කර ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන ගණනය කෙරේ.

භාවිතා කරන ලද වාර්ෂික ගාස්තු

කාර්යාල උපාංග සහ උපකරණ	10%
පිරියත සහ යන්ත්‍රෝපකරණ	10%
ගෘහ භාණ්ඩ	10%
රසායනාගාර සහ ඉගැන්වීමේ උපකරණ	20%
මෝටර් වාහන	20%
කාර්යාල උපකරණ	20%
පුස්තකාල පොත් සහ වාර සහරා	20%
උපාධි ලෝගු	20%
අස්පෘශ්‍ය වත්කම්	20%

දේපල, පිරියත සහ උපකරණ භාවිතය සඳහා පවතින විට දේපල, පිරියත සහ උපකරණ සඳහා ක්ෂයවීම් ලබා දී ඇත.දේපල. පිරියත සහ උපකරණ භාවිතය සඳහා ලබා ගත හැකි විට, එනම් ආයතනය විසින් අදහස් කරන ආකාරයට ක්‍රියාත්මක වීමට හැකි වන පරිදි අවශ්‍ය ස්ථානයේ සහ තත්ත්වයේ පවතින විට, දේපල කම්හල සහ උපකරණ සඳහා ක්ෂයවීම් ලබා දී ඇත. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 09/2022 ට අනුව, 2022 වර්ෂයේදී අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය අනුපාතය 10% සිට 20% දක්වා වැඩි විය.

තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2014 වර්ෂය තුළ පහත සඳහන් දේපළ, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනය කරන ලදී. ඇස්තමේන්තුගත අනාගත ජීව කාලය සැලකිල්ලට ගනිමින් ප්‍රත්‍යාගණනය කරන ලද අයිතමවල ක්ෂයවීම් සඳහා විධිවිධාන තීරණය කරන ලදී.

1. ගෘහභාණ්ඩ
2. කාර්යාල උපකරණ
3. රසායනාගාර සහ ඉගැන්වීමේ උපකරණ
4. පිරියත සහ යන්ත්‍රෝපකරණ

මෙම ගොඩනැගිල්ල 2018 වසරේදී තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රත්‍යාගණනය කරන ලදී. විස්තර පහත දක්වා ඇත.

ප්‍රත්‍යාගණනය කිරීමට පෙර ගොඩනැගිල්ලේ පොත් වටිනාකම	= Rs. 16,834,831
ප්‍රත්‍යාගණනය කළ මුදල	= Rs. 163,340,000
ප්‍රත්‍යාගණනය කිරීමේ ලාභය	= Rs. 146,505,169

වසර 38 ක ජීව කාලයක් ඇස්තමේන්තු කරමින් ගොඩනැගිල්ලේ අගය ක්ෂය කරන ලදී.

2021 දී ලංකා ඔටෝමොබයිල් සංගමය විසින් මෝටර් රථ ප්‍රත්‍යාගණනය කරන ලදී. ඇස්තමේන්තුගත අනාගත ආයු කාලය සැලකිල්ලට ගනිමින් මෝටර් රථ ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන තීරණය කරන ලදී.

ප්‍රත්‍යාගණනය කිරීමට පෙර වාහනවල පොත් වටිනාකම	=Rs. 0
ප්‍රත්‍යාගණනය කළ මුදල	=Rs. 16,000,000
ප්‍රත්‍යාගණනය කිරීමේ ලාභය	=Rs. 16,000,000

ආයෝජන
ස්ථාවර තැන්පතු වලින් සමන්විත ආයෝජන අවසාන අලුත් කිරීමේ දිනට තැන්පතු වටිනාකමින් දක්වා ඇත.

1.5 **ජංගම වගකීම්**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යනු මූල්‍ය තත්ත්වය ප්‍රකාශ කළ දින සිට වසරක් ඇතුළත පියවීමට අපේක්ෂිත ඒවා වේ.

1.6 විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්

(අ) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිතය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19 පරිදි, ආයතනය පාරිතෝෂිත සූත්‍ර ක්‍රමය මත පදනම්ව පාරිතෝෂික වගකීම් සඳහා ප්‍රතිපාදන සපයා ඇත.

1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීම් පනතට අනුව, සේවකයකු විසින් වසර 5 ක අඛණ්ඩ සේවයක් සම්පූර්ණ කිරීමෙන් පසු ගෙවීමේ වගකීම පැන නගී.

(ආ) නිශ්චිත දායකත්ව සැලසුම්- විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල, විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල සහ සේවක භාර අරමුදල

විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය තෝරා නොගත් සේවකයින් සම්බන්ධයෙන්, ආයතනය විසින් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට සේවකයින්ගේ දළ වැටුපෙන් (ජීවන වියදම් දීමනාව ඇතුළුව) 15%ක් දායක කරයි.

විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට සම්බන්ධ වී ඇති සේවකයින් සම්බන්ධයෙන්, ආයතනය විසින් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට සහ විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලට පිළිවෙළින් සේවකයන්ගේ දළ වැටුපෙන් 7%ක් සහ 8%ක් දායක කරයි.

සේවක භාර අරමුදලට ආයතනයේ දායකත්වය සේවකයන්ගේ දළ වැටුපෙන් 3% කි.

1.7 අයභාරය හඳුනාගැනීම

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ආදායම්, සේවා සපයනු ලබන කාල සීමාව තුළ උපචිත පදනමක් මත හඳුනා ගැනේ. එසේ නොමැති නම්, ආයතනයේ ආදායම යම් අවස්ථාවක දී හඳුනා ගැනේ. අනාගත කාල පරිච්ඡේද සඳහා කල්තියා ලැබුණු ආදායම, වත්මන් වගකීම් යටතේ කල් දැමූ ආදායමක් ලෙස සටහන් වේ. ක්‍රියාකාරී සිසුන්ගෙන් සහ අනෙකුත් ඉගෙනුම් හවුල්කරුවන්ගෙන් ගාස්තු එකතු කිරීම සිදුවිය හැකි විට, ආදායම උපචිත වන අතර ලැබිය යුතු දෑ ලෙස වාර්තා කරනු ලබයි.

(අ) ලැබිය යුතු දෑ කපා හැරීමේ ප්‍රතිපත්තිය

විවිධ හේතූන් මත ඕනෑම ලියාපදිංචි ශිෂ්‍යයෙකු හෝ වෙනත් ඉගෙනුම් හවුල්කරුවෙකු පාඨමාලා කාලය තුළ ඕනෑම අවස්ථාවක ආයතනයෙන් ඉවත් විය හැකිය. පහත සඳහන් ඕනෑම කොන්දේසියක් යටතේ ශිෂ්‍යයෙකු අක්‍රිය ලෙස වර්ගීකරණය කළ යුතුය:

1. ශිෂ්‍යයා ආයතනයට ලිඛිතව දැනුම් දීමක් කර විධිමත් ලෙස පාඨමාලාවෙන් ඉවත් වී ඇත.
2. ශිෂ්‍යයා අඛණ්ඩ අධ්‍යයන වාර දෙකක් සඳහා වාර-අවසන් විභාග සඳහා පෙනී සිටීමට අපොහොසත් වී ඇත.
3. ශිෂ්‍යයා පාඨමාලාවේ නියමිත කාල සීමාව තුළ උපාධිය සඳහා අවශ්‍ය අධ්‍යයන සම්භාර ගණන රැස් කර ගෙන නොමැත.

එවැනි අක්‍රිය සිසුන්ගෙන්/වෙනත් ඉගෙනුම් හවුල්කරුවන්ගෙන් ලැබිය යුතු ලෙස සටහන් කර ඇති මුදල් අය කළ නොහැකි ලෙස සලකනු ලබන අතර ගිණුම් පොත්වලින් කපා හරිනු ලැබේ. කලින් අක්‍රියව සිටි නමුත් පසුව එකම කණ්ඩායම තුළ ක්‍රියාකාරී ලෙස නැවත වර්ගීකරණය කරන ලද සිසුන්ගෙන් ලැබෙන මුදල් ඒම වර්ෂයේ ආදායම ලෙස පිළිගැනේ.

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2024 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය

(ආ) නැවත ලියාපදිංචි වූ සිසුන්

තම මුල් කණ්ඩායම සඳහා නියමිත කාලය තුළ පාඨමාලාව දිගටම කරගෙන යාමට සහ සම්පූර්ණ කිරීමට නොහැකි ලියාපදිංචි වූ සිසුන්ට ඉදිරි කණ්ඩායමක් සඳහා නැවත ලියාපදිංචි විය හැකිය. පෙර වසරවල කලින් ගෙවා ආදායමක් ලෙස හඳුනාගෙන ඇති ඕනෑම මුදලක් නව කණ්ඩායමේ පාඨමාලා ගාස්තුවට බැර කරනු ලැබේ (හිලව් කිරීම). ඉතිරි ශේෂය අදාළ ගෙවීම් සැලැස්මට අනුකූලව පියවිය යුතු අතර, නව කණ්ඩායම සඳහා අනුරූප ලැබිය යුතු මුදලක් හඳුනා ගනු ලැබේ. පෙර කණ්ඩායම සඳහා අදාළ ලැබිය යුතු දේ කපා හරිනු ලැබේ.

1.8 (අ) වියදම් හඳුනාගැනීම

දැරූ පිරිවැය සහ නිශ්චිත ආදායම් අයිතමවල ඉපැයීම් අතර සෘජු සම්බන්ධතාවයක් මත පදනම්ව මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ වියදම් හඳුනා ගැනේ. ආයතනය පවත්වාගෙන යාමේදී සහ දේපළ, පිරියත සහ උපකරණ කාර්යක්ෂමව පවත්වාගෙන යාමේදී දරන ලද සියලුම වියදම් ආදායමට අය කර ඇත.

(ආ) අවිනිශ්චිත වගකීම්

නඩු පැවරීමෙන් පැන නගින වගකීම් සම්බන්ධයෙන් ගිණුම්වල කිසිදු ප්‍රතිපාදනයක් සකසා නොමැත. ආයතනයේ ඩුබායි හි ජාත්‍යන්තර මධ්‍යස්ථානයේ රුපියල් මිලියන 58.2 ක වංචාවක් සම්බන්ධයෙන් 2011 දී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් ගොනු කරන ලද අතර, වැඩිදුර ක්‍රියාමාර්ග සඳහා මෙම කාරණය නීතිපතිවරයා වෙත යොමු කර ඇති අතර 2024 දෙසැම්බර් 31 වන දිනට කිසිදු වගකීමක් නොමැත, විස්තර පහත පරිදි වේ,

සටහන	හර	බැර
සටහන 08. ඉන්වෙන්ටරි - ප්‍රකාශන	**832,912**	
සටහන 11. මුදල් සහ මුදල් සමාන දේ බැංකු ගිණුම (ජාත්‍යන්තර මධ්‍යස්ථානය) ගිණුම් අංකය 021580683001	**87,461**	
සටහන 18. වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ උපචිත වියදම්		**7,860,000** **3,743,217**
සටහන 10.3 අනෙකුත් ලැබිය යුතු මුදල් සහ තැන්පතු	**438,000**	
සටහන 09. අත්තිකාරම් සහ පෙරගෙවුම්	**1,641,000**	

මුදල් ප්‍රවාහ ප්‍රකාශය
මුදල් ප්‍රවාහ ප්‍රකාශන ලෙස හඳුන්වන මුදල් සහ මුදල් සමාන දෑ, අතේ ඇති මුදල්, ඉල්ලුම් තැන්පතු සහ කෙටි කාලීන ආයෝජන වලින් සමන්විත වේ.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිය අංක 2 මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට අනුකූලව මුදල් ප්‍රවාහ සකස් කිරීමේ "වක්‍ර ක්‍රමය" භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කර ඇත.

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2024 දෙසැම්බර් 31 දිනට

රු.

	2024	**2023** නැවත ප්‍රකාශිත
සටහන 01 . පාඨමාලා ගාස්තු		
MBA (2019/2020)	767,188	-
MBA (2021/2022)	-	170,250
